2022

වාර්ෂික වාර්තාව



BOI
SRI LANKA

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය



පටුන

සභාපතිතුමාගේ පණිවුඩය 01

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය 02

අධ්‍යක්ෂ මණ්ඩලය 03

ආයෝජන මණ්ඩලයේ පැතිකඩ 04

දැක්ම, මෙහෙවර සහ වටිනාකම් 05

සුවිශේෂී සිදුවීම් 06

ජාතික ආර්ථිකයට ආයෝජන මණ්ඩලයේ දායකත්වය 07

2022 වසරේ කාර්යසාධනය 09

ශ්‍රී ලංකාව සෘජු විදේශ ආයෝජන සඳහා ආකර්ෂණීය ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම 12

විශිෂ්ටතා සම්මාන 13

වැදගත් සිදුවීම් 14

ආයෝජකයින් සමග සම්බන්ධතාවය 16

ආයෝජකයින්ගේ අදහස් 17

ජාත්‍යන්තර හවුල්කරුවන් සමග කටයුතු කිරීම 19

කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය 20

ආයෝජන කලාප සංවර්ධනය 21

ගෝලීය ආයෝජන ප්‍රවණතාවය 2022 - 2023 22

ඉදිරි දැක්ම 24

මානව ප්‍රාග්ධනය 25

සාමාජීය බලපෑම 27

2022 වසරේ මූල්‍ය සමාලෝචනය 28

2022 වසරේ මූල්‍ය ප්‍රකාශන 30

2022 විගණකාධිපතිවරයාගේ වාර්තාව 74

2022 විගණකාධිපතිවරයාගේ වාර්තාව සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පිළිතුරු 84

විගණන කමිටු වාර්තාව 93

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා සම්බන්ධ විමසීම් 94



සභාපතිතුමාගේ පණිවුඩය

"ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආයෝජන ප්‍රවර්ධනය සඳහා වන රටේ කේන්ද්‍රස්ථානය"

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) 1978 වර්ෂයේදී එහි ආරම්භයේ පටන්ම ශ්‍රී ලංකාවේ ආර්ථිකය නව දිශානතියකට යොමුකිරීම හා හැඩගැස්වීම සඳහා මූලික වශයෙන් දායකවූ ආයතනය වේ. දකුණු ආසියානු කලාපයේ ප්‍රථම ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනය වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, රැකියා හා අපනයන ඉපයීම් උත්පාදනය කරමින් ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ ප්‍රමුඛ ආයතනය විය.

සමාලෝචනයට ලක්වන වසර තුළ වැදගත් ආර්ථික වෙනසක් ඇතිකිරීම සහ ඇ.ඩො. බිලියන 3ක සෘජු විදේශ ආයෝජන (FDI) ආකර්ෂණය කරගැනීම ඉලක්ක කරගත් ආයතනික සැලසුම් ඇතුළත් නවතම ආයතනික උපායමාර්ග සැලසුමක් වසර පහක කාලයක් සඳහා සකස් කරන ලදී.

නව තාක්ෂණ ප්‍රවණතාවයන් විශේෂයෙන්ම Industry 4.0 ආරම්භ කිරීමත් සමග සෘජු විදේශ ආයෝජන (FDI) ආකර්ෂණය කරගැනීම සහ ව්‍යාපාරයන්හි කාර්යක්ෂමතාවය වැඩිකිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඩිජිටල්කරණය කරා යොමු විය. මෙහිදී ව්‍යාපාර පහසුකිරීම සඳහා ප්‍රමුඛතාවය දෙමින් ප්‍රශස්ත ව්‍යාපාරික ප්‍රගතියක් අත්කර ගැනීම සඳහා නව ප්‍රවේශයක් අවශ්‍යවේ. ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචිවී ඇති යම් ව්‍යවසායයකට ආයෝජන මණ්ඩල කාර්යාලයට නොපැමිණ ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් අදාල ලේඛණ ඉදිරිපත් කළහැකි මාර්ගගත ක්‍රමවේදයක් (Paperless Documentation Platform) ක්‍රියාත්මක කර ඇත. මෙම ක්‍රමවේදයේ මූලික අරමුණ වන්නේ ක්‍රියාවලින් සරල කිරීම හා ක්‍රමවත් කිරීම මගින් අපගේ වටිනා ව්‍යවසායයන්ට කඩිනම් සේවාවක් සැළසීමයි.

ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම සහ අදාල ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කරමින් ආයෝජකයින් සඳහා කාර්යක්ෂම සේවාවක් සැළසීමේ අභිප්‍රායෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බටහිර කුළුනෙහි 27 වන මහලේ ආයෝජක පහසුකම් සැළසීමේ මධ්‍යස්ථානයක් (IFC) ස්ථාපනය කර ඇත. වැඩි ප්‍රතිලාභ ලැබෙන මහ පරිමාණ ව්‍යාපෘති ආකර්ෂණය කරගැනීම සහ ඒ සඳහා පහසුකම් සැළසීම වෙනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ජාත්‍යන්තර ආයතනයන්හිද පිළිගැනීමට ලක්ව ඇති බව සමාලෝචිත වසර තුළ සම්මාන දෙකක් හිමිකර ගැනීම තුලින් පෙනී යයි. 2022 වාර්ෂික ආයෝජන රැස්වීමේදී (AIM) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය දකුණු, නැගෙනහිර ආසියානු සහ ඕෂනියා කලාපයේ ඉහල කාර්යසාධනයක් සහිත ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතන අතුරින් දෙවන ස්ථානය සඳහා වන රජත සම්මානය දිනාගැනීමට සමත්වූ බව සතුටින් සඳහන් කරමි.


ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන සැකසුම් කලාපය වන කටුනායක අපනයන සැකසුම් කලාපය (KEPZ), 2022 වසරේදී ලොවපුරා රටවල් අතර වාර්ෂික නිදහස් වෙළඳ කලාප ශ්‍රේණිගත කිරීමේදී කලාපයේ ප්‍රමුඛතම කාර්මික හා නිදහස් වෙළඳ කලාප වලින් එකක් ලෙස සිය තත්ත්වය තවදුරටත් ශක්තිමත් කරගනිමින් එහි ප්‍රතිආයෝජන උපායමාර්ග වෙනුවෙන් විශේෂ ගෞරවයක් හිමිකරගෙන ඇත. එක්සත් රාජධානියේ fDi Intelligence Free Zone Awards සම්මාන උළෙල මගින් මෙම සම්මානය පිරිනමනු ලැබිය.

එක් පවුලක් ලෙස ආයෝජන මණ්ඩලයේ අපගේ සියලු අත්දැකීම් සාමාජිකයින් වටා ගොඩනැගී තිබේ. මෙම වසර තුළ ආයෝජන මණ්ඩල ඉතිහාසයේ වැඩිම සේවක සංඛ්‍යාවක් විශ්‍රාම යන අතර මෙය ඔවුන්ට කෘතගුණ දැක්වීමට සුදුසු අවස්ථාවයි. එබැවින් මෙය විශේෂ වාර්ෂික වාර්තාවක් වන අතර දශක ගණනාවක් පුරා ආයෝජන මණ්ඩලයේ මූලිකත්වය ගෙන කටයුතු කළ අප ජ්‍යෙෂ්ඨ සහෘදයන්ට අපගේ හදපිරි ප්‍රණාමය පිරිනමන අතර අපි සැමදා හදවතින්ම ඔබලා සමග සිටිමින් සතුට සොභාග්‍යය පිරි විශ්‍රාම දිවියක් ප්‍රාර්ථනා කරමු.

අවසාන වශයෙන් අපගේ මානව ප්‍රාග්ධනය පිළිබඳවද සඳහන් කළ යුතුය. මේ වනවිටත් අප ආයතනයේ වඩාත්ම වැදගත් සාධකය වන මානව සම්පතේ නිපුණතා වැඩිදියුණු කිරීම සහ ඔවුන්ට දැනුම ලබාදීම සම්බන්ධයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. ඩිජිටල් ආර්ථිකයක් තුළ සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීමට හැකිවන සේ සේවාලාභී අත්දැකීම්වල ඩිජිටල් පරිවර්තනයක් තුළින් අපගේ කාර්ය මණ්ඩලයට වර්තමානයට සහ අනාගතයට ගැලපෙන වටපිටාවක වැඩකිරීමේ හැකියාව එමගින් ලබාදෙනු ඇත.

ඉංජිනේරු රාජා එදිරිසූරිය

සභාපති
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය



අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය

"සියලු ධනාත්මක ආරම්භයන් සමගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආයෝජන සඳහා වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට දායකවී ඇත"

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) 2022 වසරේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ඉමහත් සතුටකි. කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ඇතිවූ ගෝලීය ආර්ථික පසුබෑම සහ එහි ප්‍රතිඵලයක් ලෙස පැනනැඟි දේශපාලන අස්ථාවරත්වය සහ වෙළඳ අවදානම හේතුකොට ගෙන ඇතිවූ අයහපත් ආයෝජන වාතාවරණය යටතේ පසුගිය වසර අනපේක්ෂිත අභියෝග ගෙන දුන් වසරක් විය.

මෙම බාධක සහ අභියෝග මධ්‍යයේ ශ්‍රී ලංකාව සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ සැලකියයුතු අර්බුදයකට මුහුණ දී ඇත. කෙසේවුවද, වඩා හොඳ ආයෝජන වාතාවරණයක් ඇතිකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2022 වසරේදී ආරම්භ කරන ලද ආයෝජක පහසුකම් සැළසීමේ මධ්‍යස්ථානය (IFC) ස්ථාපනය කිරීම, ආයෝජන මණ්ඩලයේ ක්‍රියාවලි ඩිජිටල්කරණය, ප්‍රතිආයෝජන ප්‍රවර්ධනය, හවුල්කාරිත්ව සෙවුම් ද්වාරය දත්ත ගබඩාව හඳුන්වාදීම සහ වසර පහක නේවාසික වීසා වැඩසටහන හරහා ආයෝජන මණ්ඩලය අඛණ්ඩ සේවාවක් තහවුරු කරඇති අතර මෙම අර්බුදකාරී කාල සීමාව ඔස්සේ ආර්ථික අභියෝග මධ්‍යයේ ඉදිරියට යාමට දැනට සිටින ව්‍යවසායයන්ට සහය ලබාදෙනු ලැබීය.

2022 වසර තුළ ආයෝජන මණ්ඩලය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 2030 න්‍යාය පත්‍රයේ ඇතුලත් තිරසර සංවර්ධන අභිමතාර්ථයන් සාක්ෂාත් කරගැනීමට අපගේ කැපවීම් හා සමගාමීව මෙම වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2022-2026 උපාය මාර්ගික රාමුව දියත් කරනු ලැබීය. උසස් මට්ටමේ ප්‍රමිතියෙන් යුත් තිරසාර සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කිරීම අරමුණු කරගත් මෙම උපාය මාර්ගික ප්‍රවේශය රැකියා අවස්ථා බිහිකරමින්, අපනයන ආදායම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් රජයේ ආර්ථික සංවර්ධන න්‍යාය පත්‍රය සඳහා කැපීපෙනෙන ලෙස දායකවනු ඇත.

ආයෝජන සඳහා පහසුකම් සැළසීම, සමස්ත ආයෝජන ප්‍රතිපත්තිය යටතේ උත්තේජකාරකයක් ලෙස හඳුනාගෙන ඇති අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මූලික විමසුමේ සිට ඔවුන්ගේ සම්පූර්ණ ව්‍යාපෘති චක්‍රය පුරාවටම ආයෝජකයින් සමග එක්ව කටයුතු කරනු ලැබේ. සාර්ව ආර්ථික අභියෝග හමුවේ වුවද, 2022 වසරේ රටතුළට සෘජු විදේශ ආයෝජන ගලනය ඇ.ඩො. බිලියන 1ක ඉලක්කය පසුකළ අතර එය ඇ.ඩො. බිලියන 1.076ක් කරා ළඟාවූ බව සතුටින් ප්‍රකාශ කරමි.

මෙය 2021 වසර හා සන්සන්දනය කිරීමේදී 38%ක වර්ධනයකි. මීට අමතරව 2021 වසර හා සන්සන්දනය කිරීමේදී 2022 වසරේදී ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන්ගේ අපනයනයන් 8%කින් වැඩිවූ අතර මෙය 2019 වසරේ කොවිඩ් - 19 වසංගතයට පෙර පැවති තත්ත්වය හා සන්සන්දනය කිරීමේදී 10%ක වැඩිවීමකි. තවද, 2022 වසරේ රටේ කාර්මික අපනයනයෙන් 80%ක් සඳහා දායකවෙමින් ආයෝජන මණ්ඩලය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබීය.

2022 වසරේදී වාර්ෂික ආයෝජන සමුළු (AIM) සම්මාන උළෙලේදී දකුණු, නැගෙනහිර ආසියානු සහ ඕෂනියා කලාපයේ හොඳම කාර්යසාධනයක් සහිත ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතන අතුරින් දෙවන ස්ථානය සඳහා වන රජත සම්මානය දිනාගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමත්විය. ඊට අමතරව ආයෝජන මණ්ඩලයේ විශාලතම අපනයන සැකසුම් කලාපය වන කටුනායක අපනයන සැකසුම් කලාපය එහි ප්‍රතිආයෝජන උපායමාර්ග සඳහා නිදහස් කලාප සම්මාන 2022දී විශේෂ ගෞරවයක් හිමිකරගනු ලැබීය.

දේශීය මෙන්ම විදේශීය ආයෝජකයින්ගේ අමිල සහය නොමැති නම් අපට අපගේ ජයග්‍රහණ කිසිවක් ළඟාකර ගැනීමට නොහැකි වනු ඇත. ශ්‍රී ලංකාවේ විභව්‍යතාවය කෙරෙහි තැබූ විශ්වාසය වෙනුවෙන් ඔවුන්ට මාගේ හදපිරි කෘතඥතාවය පිරිනමමි. ආයෝජන ව්‍යාපෘති වෙනුවෙන් පහසුකම් සැළසීම සඳහා අඛණ්ඩව සහයෝගීතාවය සහ සහය ලබාදුන් අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සඳහා මාගේ ප්‍රශංසාව හිමිවේ. දැඩි උද්‍යෝගය හා වෘත්තීයභාවය තුළින් ආයතනය සාර්ථකත්වය කරා රැගෙනගිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කැපවූ සේවක කණ්ඩායමේ දායකත්වය පිළිබඳවද මෙහිදී සඳහන් කළ යුතුය.

ඉදිරියේදී ද, ශ්‍රී ලංකාවේ සෞභාග්‍යමත් ආයෝජන වටපිටාවක් ඇතිකිරීමේ සිය අඛණ්ඩ මෙහෙවර වෙනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඉදිරි දැක්මක් සහිතව කටයුතු කරයි. උසස් තත්ත්වයේ සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම, ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම සහ මෙරට තිරසර අනාගතයක් ගොඩනැගීම සඳහා තවදුරටත් නව වැඩසටහන් ආරම්භ කිරීමට හා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අප කැපවී සිටින්නෙමු.

රේණුකා එම් වීරකෝන්

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය



ඉංජිනේරු රාජා එදිරිසූරිය
සභාපති
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

ආචාර්ය ලෝරන්ස් පෙරේරා මහතා
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී - මයික්‍රෝ හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගම



ආචාර්ය ලෝරන්ස් පෙරේරා මහතා මයික්‍රෝ හෝල්ඩින්ග්ස්, ට්‍රාන්ස්මෙක් සමූහ ව්‍යාපාරයේ සහ මයික්‍රෝ කාර් සමාගමේ සමාරම්භක වේ. ඔහු මේ වනවිට මයික්‍රෝ හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගම, මයික්‍රෝ කාර් සමාගම, ට්‍රාන්ස්මෙක් ඉංජිනේරු සමාගම, ට්‍රාන්ස්මෙක් ජාත්‍යන්තර සමාගම, මයික්‍රෝ කාර් ඉන්ටර්නැෂනල් කොන්සෝටියම්, යුරෝ ස්පෝර්ට්ස් ඔටෝ ලංකා (පෞද්ගලික) සමාගම සහ සුපර්ලැටිව් දේපළ (පෞද්ගලික) සමාගම යන සමාගම්හි සභාපති/ප්‍රධාන විධායක නිලධාරී ලෙස සේවය කරයි. ව්‍යක්තියෙන් මෝටර් රථ ඉංජිනේරුවකු වන ඔහු දේශීය හා විදේශීය වශයෙන් මෝටර් රථ ඉංජිනේරු කර්මාන්තයේ වසර 44කට වැඩි අත්දැකීම් සහිතය. දේශීයව මෙන්ම විදේශයන්හිද මෝටර් රථ ක්ෂේත්‍රයේ කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු කිපයක්ම හොඹවන ලද අතර BMW, ජර්මනියේ වොක්ස්වැගන් සහ ප්‍රංශයේ පෙ(ර්)ජෝ සමාගම්හි මනා පුහුණුවක් ලබා ඇත.

2017 වසරේදී චීනයේ මර්සිඩීස් බෙන්ස් මෝටර් රථ එකළස් කිරීමේ සමාගම මෙන් ලොව ප්‍රධාන පෙළේ Fortune 500 සමාගම් 2ක් වන ගීලි මෝටර්ස් සහ බීජින් ඔටෝමෝටිව් ඉන්ඩස්ට්‍රි හෝල්ඩින්ග් කම්පනි ලිමිටඩ් (BAIC) සඳහා පළමුවරට ශ්‍රී ලංකාවේ වාහන එකළස් කිරීමේ කාර්යය ආරම්භ කරන ලද්දේ අචාර්ය පෙරේරා විසිනි. 2014 වසරේදී ඔහු විසින් මෙරට ප්‍රථම ස්වයංක්‍රිය මෝටර් රථ එකළස් කිරීමේ මෙහෙයුම් ආරම්භ කරන ලදී.

කොළඹ ශාන්ත පීතර විද්‍යාලයෙන් පාසැල් දිවිය ආරම්භ කළ ආචාර්ය පෙරේරා 1974 වසරේදී මහනුවර ශාන්ත අන්තෝනි විද්‍යාලයෙන් සිය පාසල් දිවිය නිම කළේය. ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශයන්හි මෝටර් රථ කර්මාන්තය සඳහා දක්වන ලද සුවිශේෂී දායකත්වය වෙනුවෙන් 1997 දී ඔහුට ආචාර්ය උපාධිය පිරිනමනු ලැබීය. 2007 වසරේදී දේශමාන්‍ය, දේශකීර්ති සහ ජනරංජන යන ගෞරව පදවි පිරිනමනු ලැබීය.

ජනාධිපති නීතිඥ කුෂාන් ඩි අල්විස් මහතා,
නීතිඥ



1985 වසරේදී නීතිඥ ව්‍යක්තියට පිවිසි කුෂාන් ඩි අල්විස් මහතා වසර 36කට වැඩි කාලයක් ක්‍රියාකාරී ලෙස සිය ව්‍යක්තියෙහි නියළී සිටී. ඔහු විසින් බෙරුමිකරණය, ආයතනික නෛතික කටයුතු පිළිබඳ උපදෙස් ලබාදීම, නියාමන රාමු, අනුකූලතා අවශ්‍යතාවන් සහ විකල්ප ආරවුල් නිරාකරණය කිරීමේ කාර්යයන්හි ක්‍රියාකාරී ලෙස නියළී සිටී. මේවන විට ශ්‍රී ලංකා ජාතික සමගිය සහ සංහිදියා කාර්යාලයේ (ONUR) සභාපතිවරයා වන ඔහු කොළඹ කොටස් වෙළඳපලෙහි ලයිස්තුගත සමාගම්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාජිකයෙකු ලෙසද කටයුතු කරනු ලබයි.

අල්විස් මහතා 2011 සිට 2015 දක්වා කාලයෙදී නීති කොමිෂන් සභාවේ සාමාජිකයෙකු විය. ඔහු බදු අභියාචනා කොමිෂන් සභාවේ නීති උපදේශක මණ්ඩලයේද සාමාජිකයෙකු විය. අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිලිබඳ මහජන නියෝජිත කමිටුවේ සමාජිකයෙකු ලෙසද කටයුතුකර ඇති අතර ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ උපසභාපතිවරයා ලෙසද සේවයකර ඇත.

අතුල හපුතන්ත්‍රි මහතා
කළමනාකාර අධ්‍යක්ෂ - තන්ත්‍රි ට්‍රේලර්ස් (පෞද්ගලික) සමාගම



අතුල හපුතන්ත්‍රි මහතා තන්ත්‍රි ට්‍රේලර්ස් (පෞද්ගලික) සමාගම, තන්ත්‍රි ට්‍රේලර්ස් ඇන්ඩ් ඉක්විප්මන්ට් (පෞද්ගලික) සමාගම සහ ටෙකෝ ලංකා (පෞද්ගලික) සමාගම්හි කළමනාකාර අධ්‍යක්ෂවරයාවේ. ඔහු ග්‍රැන්ඩ් උඩවලව සෆාරි රිසෝට්හි අධ්‍යක්ෂවරයා ලෙසද සේවයකර තිබේ. වෝකර් සන්ස් සමාගමේ පුහුණුවන සාගර ඉංජිනේරුවකු ලෙස සිය ව්‍යක්තිය ආරම්භ කළ ඒ මහතා කණිෂ්ඨ ඉංජිනේරුවකු, 5වන, 4වන සහ 3වන ඉංජිනේරුවකු ලෙස MNSL නැව් සමාග මේ වසර තුනක් සේවයකර ඇත. සාගර ඉංජිනේරුවන්ගේ සමාජයේ භාණ්ඩාගාරික/සභාපති, ට්‍රක් හා ට්‍රෙලර් නිෂ්පාදකයින්ගේ සංගමයේ සභාපති, ව්‍යක්තීය සංගම් සංවිධානයේ සම සාමාජික, කර්මාන්ත සංවර්ධන සංසදයේ සභාපති, දකුණු කාර්මික කම්පුවේ සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් තනතුරු හොබවා ඇත.

ඔහු අන්තරාදායක පෙට්‍රෝලියම් නැව් බඩු හැසිරවීම සඳහා විශේෂ සුදුසුකමක් සහිතව ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 1 පන්තියේ සාගර ඉංජිනේරුවකු වශයෙන් නිපුනත්වයක් ලබා ඇත.

ජයමින් පැල්පොල මහතා
ජ්‍යෙෂ්ඨ මූල්‍ය උපදේශක



Goldman Sachs (UK) හා Nomura USA ඇතුළුව ජාත්‍යන්තර ආයෝජන බැංකුකරණය හා වත්කම් කළමනාකරණයේ වසර 10කට වැඩි පළපුරුද්දක් ඇති ජයමින් පැල්පොල මහතා වෝල් ස්ට්‍රීට්හි සිය නිර්මාණාත්මක හා වඩාත්ම ලාභදායී ආයෝජන උපාය මාර්ග සඳහා පිළිගැනීමක් ඇති සමාගමක් වන Goldman Sachsහි ප්‍රධාන උපාය මාර්ගික කණ්ඩායමේ රැකියාවෙහි නියුතු එකම ශ්‍රී ලාංකිකයා වේ. පැල්පොල මහතා සිය ව්‍යක්තියේදී විවිධ අංශයන් හා විවිධ රටවල ඇඩො. බිලියන 20ට වැඩි වටිනාකමකින් යුත් ජාත්‍යන්තර ආයෝජන ව්‍යුහගත කිරීම හා කළමනාකරණය කිරීම සිදුකර ඇත.

වර්තමානයේ ඔහු ජයරු ට්‍රේඩ් පාර්ට්නර්ස් සමාගමේ සභාපතිවරයා හා සිලෝන් එකෝ ස්පයිසස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි. ජයරු ට්‍රේඩ් පාර්ට්නර්ස් විසින් ගෝලීය වෙළඳ භාණ්ඩ වෙළඳපල සඳහා යටිතල පහසුකම්, මූල්‍යන සහ පිරිසැකසුම් සේවාවන් සපයනු ලැබේ.

ජයමින් පැල්පොල මහතා, මූල්‍ය අංශය සඳහා තාක්ෂණය හා දත්ත විද්‍යාව අදාලකර ගැනීමේ කාර්යය වෙනුවෙන් ආසියාවේ හොඳම fintech ආරම්භක සමාගම් වලින් එකක් ලෙස හඳුනාගනු ලැබූ Moneyworkz Technologies සමාගමේ ආරම්භක සභාපතිවරයා ද වේ. ජ්‍යෙෂ්ඨ උපදේශකයෙකු වශයෙන් පැල්පොල මහතා බැංකු අංශයේ ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳව එක්සත් ජනපදයේ බැංකු හා ජාත්‍යන්තර මහ බැංකු සඳහා උපදෙස් ලබාදී ඇත. විශේෂයෙන්ම ඔහු නියාමකයින්ට මෙන්ම ඇමරිකානු බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට, DBS, Wells Fargo හා Deutsche Bank සඳහා ප්‍රාග්ධන ප්‍රමාණවත්බව පිළිබඳ තීරණ, ප්‍රාග්ධනීකරණය සහ බැංකුකරණයේදී ඩිජිටල් නවෝත්පාදන යෙදවීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදෙනු ලැබීය.

හාවඩ් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇති පැල්පොල මහතා CFA Institute (USA) සහ CIMA (UK) වෙතින් මූල්‍ය හා ආයෝජන ව්‍යක්තිකයින් සඳහා පිරිනමන ව්‍යක්තිය පිළිගැනීමද ලබාගෙන ඇත. වයස අවුරුදු 20 දී ලොව ලාබාලම CIMA කළමනාකරණ ගණකාධිකාරිවරයා වූ ඔහු එවර ලාබාලම CIMA ත්‍යාගලාභියාද විය. CIM (UK) වෙතින් ඔහු සිය අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ඇත.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පැතිකඩ

1978 වර්ෂයේ දී සංස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආයෝජකයින්ට ව්‍යාපාර සඳහා පහසුකම් සලසමින් ආයෝජන ප්‍රවර්ධනය, කර්මාන්ත සංවර්ධනය හා සහය සේවාවන් සඳහා පහසු ප්‍රවේශ සලසන කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කිරීමේ විධිවිධාන සමගින් ආයෝජන ප්‍රවර්ධනය සඳහා වන ජාතික ආයතනය ලෙස කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායකවන ප්‍රධාන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, පුහුණු හා ආංශික රැකියා අවස්ථා බිහිකිරීම, අපනයන උත්පාදනය හා රටේ ආයෝජන වාතාවරණය වැඩිදියුණු කිරීම මගින් සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගනිමින් තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා දායක වේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඒ සඳහා ඉවහල්වන පරිදි සිය අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ අභිප්‍රායෙන් වේගවත්ව කටයුතු කරමින් සිය හැකියාවන් ප්‍රදර්ශනය කරන අතරම දැනට සිටින ආයෝජකයින් අතර විශ්වාසය ගොඩනැගෙන අයුරින් කටයුතු කර ඇත. ආයෝජකයින්ට පහසුකම් සැළසීමේ ප්‍රමුඛ ආයතනය ලෙස ඔවුන්ගේ ආයෝජන ගමන්මග පුරාවට ආයෝජකයින්ට සහය ලබාදෙමින් කාර්මික සහ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා අනුබලදීම සහ දිරිමත් කිරීම සිදුකරන අතරම අපනයන විවිධාංගිකරණය හා විදේශ විනිමය ඉපයීම් වැඩිකිරීම සහතික කෙරේ. බාහිර බලපෑම් මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ හා රඳවා ගැනීමේ නිපුණතාවන් අනෙකුත් ආරම්භයන් ගණනාවක් ද සමගින් ඒකාබද්ධව, සමකාලීන රටවල් අතර එහි ජාත්‍යන්තර තරඟකාරිත්වය වැඩිදියුණු කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ජාතික අයෝජන ප්‍රවර්ධන නියෝජිතායතය ලෙස පහත කාර්යභාරයන් ඉටුකරයි:

- රජයේ ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දක්වමින්, සෘජු විදේශ ආයෝජන මට්ටම ක්‍රමිකව ඉහළ නැංවීම මෙන්ම ජාතික වර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා දායකත්වයක් ලබාදෙමින් ආර්ථිකයේ ප්‍රමුඛතා අංශ කරා ආයෝජන ඉලක්ක කිරීම හා ආයෝජන ආකර්ෂණය කරගැනීම.

- ශ්‍රී ලංකාවේ ඉහල අගයක් එක්කළ/උසස් තාක්ෂණික නිෂ්පාදන, ඉහල අගයක් එක්කළ ඇඟළුම්, තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා, සංචාරක කර්මාන්තය, ආහාර පිරිසැකසුම් කිරීම, සැපයුම් සේවා, අධ්‍යාපන හා මහා පරිමාණ යටිතල පහසුකම් හෝ වෙනත් තෝරාගත් අංශවල ව්‍යාපෘති සැලසුම් කිරීමේ අභිප්‍රායෙන් යුත් ආයෝජකයින් සමඟ සම්බන්ධවන පළමු ආයතනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වේ. ආයෝජකයින්ට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තොරතුරු හා මාර්ගෝපදේශ ලබාදෙන අතර වෙනත් රේඛීය නියෝජිතායතනවල අනුමැතිය ලබාගැනීම අවශ්‍ය වන අවස්ථාවන්හිදී එම ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු ද සිදුකරයි.

- ආයෝජන අයදුම්පත් ඇගයුම් කිරීම, ආයෝජන ව්‍යාපෘති අනුමත කිරීම හා සහන ලබාදීම සඳහා අදාල අංශවල මෙන්ම මෙම ව්‍යාපෘතිවල විදේශිකයන්ට වීසා නිකුත් කිරීම සඳහා ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පහසුකම් සළසයි.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ප්‍රාග්ධන භාණ්ඩ හා අමුද්‍රව්‍ය ආනයනය මෙන්ම නිමි භාණ්ඩ අපනයනය සඳහා ද ආනයන/අපනයන නිශ්කාෂණ ලබා ගැනීම සහ පහසුකම් සැළසීම ඇතුළුව ව්‍යාපෘති ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීම සහ සාර්ථකව මෙහෙයුම් කිරීම දක්වා වන සම්පූර්ණ ව්‍යාපෘති චක්‍රය පුරා ආයෝජකයින්ට සහාය ලබාදේ.

- අවම කාලයක් තුල ආයෝජකයින්ට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පරිශ්‍ර සැපයීම සඳහා ආයෝජන මණ්ඩලය මගින් අවශ්‍ය යටිතල පහසුකම් සහිතව අපනයන සැකසුම් කලාප සංවර්ධනය කෙරේ.

"ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ව්‍යාපෘති ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීම, සාර්ථකව මෙහෙයුම් කිරීම යන සම්පූර්ණ ව්‍යාපෘති චක්‍රය පුරා ආයෝජකයින්ට සහාය ලබාදේ"



අපගේ දැක්ම

"තිරසාර ආයෝජන සඳහා ආසියාවේ වඩාත්ම ආකර්ෂණීය ගමනාන්තය බවට ශ්‍රී ලංකාව පත්කිරීම"

අපගේ මෙහෙවර

"ශ්‍රී ලංකාවට ගුණාත්මක ආයෝජන ආකර්ෂණය කරගැනීමේ හා රඳවා ගැනීමේ විභවතාවය ඉටුකිරීම සඳහා, වැඩිදියුණු කළ අපනයන පදනමක් ලබාදීමට මූලික වෙමින් සහ වඩා හොඳ රැකියා අවස්ථා ඇති කිරීමටත් නව තාක්ෂණය හා නවෝත්පාදන තුළින් දැනුම හා නිපුණතා වැඩිදියුණු කිරීමටත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ධනාත්මකව හා වේගවත් ලෙස කටයුතු කරනු ලැබේ"

වටිනාකම්

කාර්යසාධනය සහ ඉලක්ක ළඟාකර ගැනීමේ අභිලාෂය:

ආයෝජන මණ්ඩලය තාත්ත්වික ආයෝජන සහ රැකියා අවස්ථා බිහිකිරීමේ ඉලක්ක සමගින් සිය අභිලාෂයන් සාක්ෂාත් කරගැනීමටක්‍රියාකරනු ඇත.

රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර සම්බන්ධතාවය ගොඩනැගීම:

රටෙහි ආර්ථික සෞභාග්‍යය සඳහා ඉවහල්වන ආයෝජන සඳහා පහසුකම් සැළසීම, සුරක්ෂිතතාවය සහ වර්ධනය කිරීමේ අභිමානවත් කාර්යය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඉටුකරනු ලැබේ. අපගේ මෙහෙවර ඉටුකිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම ආයතන සමග සහයෝගීතාවයෙන් හා හවුල්කාරීත්වයෙන් කටයුතු කරන අතර ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කරගැනීමට ද දායක වන්නෙමු.

වෘත්තීය දැනුම සහ අඛණ්ඩතාව:

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ආයෝජකයින්ගේ අවශ්‍යතාවන් හඳුනාගැනීමට කැපවනු ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී වාණිජ හා නව්‍ය විසඳුම් ලබාදෙනු ලැබේ. අප විසින් අඛණ්ඩව, විශ්වසනීයත්වයෙන් මේ සඳහා හෘදයාංගමව කැප වී සිටින්නෙමු.

උසස් පාරිභෝගික සේවාව:

සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම සඳහා තරග කිරීමේදී ක්‍රියාකාරී මෙන්ම සුවිශේෂී මට්ටමෙන් කටයුතු කිරීම.


කාර්ය මණ්ඩලය:

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, විශිෂ්ටත්වය සඳහා සිය කාර්ය මණ්ඩලයේ දක්ෂතාවය, සහයෝගීතාවය, කැපවීම හා වගකීම අගය කරනු ඇත. කාර්ය මණ්ඩලයට සේවයේ නිරතවීම, අභිවෘද්ධිය සහ සාර්ථකත්වය ළඟාකර ගැනීම සඳහා වන සුවිශේෂී ස්ථානයක් බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පත්කිරීම කෙරෙහි අප නිරන්තර අවධානය යොමු කරන්නෙමු.




"ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආයෝජකයින්ගේ අවශ්‍යතාවන් හඳුනාගැනීමට කැපවී සිටී"

සුවිශේෂී සිදුවීම්


2022
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2022 AIM සම්මාන උළෙලේදී රජත සම්මානය දිනාගැනීම, 2022 fDi Intelligence Free Zone සම්මාන උළෙලේදී විශේෂ ඇගයීමකට ලක්වීම, ආයෝජක පහසුකම් සැළසීමේ මධ්‍යස්ථානය (IFC) ස්ථාපනය කිරීම, හවුල්කාරිත්ව සෙවුම් ද්වාරය (Partnership Finder) වැඩසටහන, විදේශීය ආයෝජකයින් සඳහා දිගුකාලීන වීසා වැඩසටහන දියත් කිරීම.
2021
රටවල් 85ක දේශීයව හා විදේශීයව 5,000කට වැඩි සහභාගිත්වයක් සහිතව ශ්‍රී ලංකාවේ ප්‍රථම ආයෝජන සමුළුව මාර්ගගතව පැවැත්වීම.
2019
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාප අතරට අළුතෙන් බිංගිරිය අපනයන සැකසුම් කලාපය එක්විය.
2020
එරාවුර් හා ආරබොක්ක (හම්බන්තොට) නව අපනයන සැකසුම් කලාප 2 සංවර්ධනය කිරීම ආරම්භ කරනු ලැබීය.
2018
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 40වන සංවත්සරය සැමරීම. ඇ.ඩො. බිලියන 2.37ක ඉහලම සෘජු විදේශ ආයෝජනයක් ලඟාකර ගනු ලැබීය. බියගම අපනයන සැකසුම් කලාපය සඳහා IR සම්මානය හිමිවිය.
2014
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් - "ආසියා ශාන්තිකර ව්‍යාපාරික සංසදය 2014" සඳහා අනුග්‍රාහකත්වය ලබාදෙනු ලැබීය.
2009
ISO9001:2000 ලබාගත් ප්‍රථම රාජ්‍ය ආයතනය වුයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයයි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ යාපනය කාර්යාලය පිහිටුවනු ලැබීය.
2011
ඇ.ඩො. බිලියන 1ක සෘජු විදේශ ආයෝජන ඉලක්කය ළඟාකරගනු ලැබීය.
2013
2013 දී "පොදු රාජ්‍ය මණ්ඩල නායකයින්ගේ සමුළුවට" (CHOGM) සමගාමීව පැවති "පොදු රාජ්‍ය මණ්ඩලයීය ව්‍යාපාරික සංසදය" සංවිධානය කිරීමේ මූලිකත්වය ගනු ලැබුයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයයි.
2008
ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මහල් 09ක් මිලදී ගෙන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ස්ථිර ලෙස ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ ස්ථාපනය කිරීම.
2006
කර්මාන්ත ග්‍රාමීය අංශය වෙත ගෙනයාමේ අරමුණ ඇතිව "ව්‍යවසායන් 300 වැඩසටහන" ආරම්භ කරනු ලැබීය.
1999
හොරණ අපනයන සැකසුම් කලාපය හා වතුපිටිවල අපනයන සැකසුම් කලාපය පිහිටුවීම.
2000
පොල්ගහවෙල, මාවතගම හා මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාප පිහිටුවීම.
2001
සීතාවක කාර්මික උද්‍යානය, සීතාවක අපනයන සැකසුම් කලාපය ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පවරා ගැනීම.
1998
මීරිගම අපනයන සැකසුම් කලාපය (EPZ) හා මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය (EPP) පිහිටුවීම.
1995
මහනුවර කාර්මික උද්‍යානය පිහිටුවීම.
1991
දකුණු පළාත සංවර්ධනය කිරීම සඳහා කොග්ගල අපනයන සැකසුම් කලාපය පිහිටුවීම.
1992
1992 අංක 49 දරන පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) සංස්ථාපනය කරනු ලැබූ අතර එය මහ කොළඹ ආර්ථික කොමිසමේ (GCEC) අනුප්‍රාප්තිකයා වේ. විරැකියාව අවම කිරීම සඳහා රජයේ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ "ඇගළුම් කම්හල් 200 වැඩසටහන" හඳුන්වා දෙනු ලැබීය.
1990
විදේශ ආයෝජන උපදේශන කමිටුව හා මහ කොළඹ ආර්ථික කොමිසම එකට එක්වූ අතර ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන අනුමත කිරීමේ පූර්ණ අධිකාරිය මහ කොළඹ ආර්ථික කොමිසමට හිමිවිය..
1986
අපනයන සැකසුම් කලාපයන්හි ව්‍යවසායන්ට සහයදීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම මගින් රැකියා බැංකුව ඇතිකිරීම. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දෙවන අපනයන සැකසුම් කලාපය ලෙස 1986දී බියගම අපනයන සැකසුම් කලාපය ස්ථාපනය කිරීම.
1978
1978 අංක 04 දරණ පාර්ලිමේන්තු පනත යටතේ මහ කොළඹ ආර්ථික කොමිසම (GCEC) ස්ථාපනය කිරීම.
1979
ශ්‍රී ලංකාවේ ප්‍රථම හා මේ දක්වා පවත්වාගෙන යන විශාලම අපනයන සැකසුම් කලාපය වන කටුනායක අපනයන සැකසුම් කලාපය 1979දී ස්ථාපනය කිරීම.


ජාතික ආර්ථිකයට ආයෝජන මණ්ඩලයේ දායකත්වය

රට තුළට සෘජු විදේශ ආයෝජන ගලනයන් (1978 - 2022)




ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ අපනයනයන්


ආයෝජන මණ්ඩලයීය අපනයනයන් (වෙළඳ භාණ්ඩ සහ සේවාවන්) 1979 - 2022



ජාතික වෙළඳ භාණ්ඩ අපනයනයන්ට සාපේක්ෂව ආයෝජන මණ්ඩල අපනයනයන් (2013 - 2022)




අපනයන කාර්යසාධනය කෙරෙහි ආයෝජන මණ්ඩලයේ දායකත්වය (ආංශික)



සමස්ත ජාතික අපනයනයෙන් **66%**

- ජාතික ඇඟළුම් අපනයනයෙන් 99%
- ජාතික සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ සහ පාවහන් අපනයනයෙන් 93%
- ජාතික රබර් අපනයනයෙන් 91%
- ජාතික යන්ත්‍ර සහ යාන්ත්‍රික උපකරණ අපනයනයෙන් 83%




සමස්ත කාර්මික අපනයනයෙන් **80%**

- ජාතික මුද්‍රණ කර්මාන්ත නිෂ්පාදන අපනයනයෙන් 88%
- ජාතික රෙදිපිළි අපනයනයෙන් 81%
- ජාතික ප්‍රවාහන උපකරණ අපනයනයෙන් 81%


ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් හා ආයෝජන කලාපවල භූගෝලීය ව්‍යාප්තිය



දිස්ත්‍රික්කය	ව්‍යාපෘති සංඛ්‍යාව
1 කොළඹ	452
2 ගම්පහ	381
3 කළුතර	111
4 පුත්තලම	71
5 ගාල්ල	62
6 කුරුණෑගල	62
7 නුවර එළිය	58
8 මහනුවර	52
9 රත්නපුර	39
10 කෑගල්ල	35
11 බදුල්ල	32
12 හම්බන්තොට	31
13 මාතලේ	31
14 මාතර	23
15 මඩකලපුව	16
16 අනුරාධපුරය	14
17 ත්‍රිකුණාමලය	12
18 අම්පාර	9
19 මොණරාගල	8
20 පොළොන්නරුව	8
21 යාපනය	7
22 වවුනියාව	5
23 කිලිනොච්චිය	3
24 මුලතිවු	2
එකතුව	**1,524**




ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් මගින් රැකියා උත්පාදනය



2022 වසරේ කාර්යසාධනය

වසර පිළිබඳ සංක්ෂිප්ත සටහනක්





2022 වසරේ ව්‍යාපෘති කාර්යසාධනය

අනුමත ආයෝජන ව්‍යාපෘතීන්

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 2022 වසර තුළ ඇ.ඩො. බිලි. 1.82ක ඇස්තමේන්තුගත වටිනාකමකින් යුත් ආයෝජන ව්‍යාපෘති 160ක් (නව ව්‍යාපෘති 72ක් සහ දැනට පවතින ව්‍යාපෘති පුළුල් කිරීම් 88ක්) සඳහා අනුමැතිය ලබා දී ඇත.

ඇ.ඩො. බිලි. 1.82


අනුමත ආයෝජනයන්හි වටිනාකම

160

අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව


25,430


රැකියා අවස්ථාවන්



නව ව්‍යාපෘති - 72
ඇ.ඩො. බිලි. 1.37 (75%)

ව්‍යාපෘති පුළුල් කිරීම් - 88
ඇ.ඩො. බිලි. 0.45 (25%)







2022 වසරේ රට තුළට සෘජු විදේශ ආයෝජන ගලනය

2022 වසර තුළ ශ්‍රී ලංකාවෙන් වාර්තාවූ සෘජු විදේශ ආයෝජනය ඇ.ඩො. මිලි. 1,076ක් විය. 2022දී සමස්ත සෘජු විදේශ ආයෝජනයෙන් වැඩිම ප්‍රමාණය (34%) නිෂ්පාදන අංශය මගින් ලැබී ඇති අතර දුරකථන සන්නිවේදන අංශය (32%), දේපළ සංවර්ධන (18%), අනෙකුත් සේවා (7%), සංචාරක හා විවේක (5%), වරාය සංවර්ධනය (3%), තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය (1%) වේ.

2022 වසරේ රට තුළට සෘජු විදේශ ආයෝජන ගලනය - ආංශික ව්‍යාප්තිය




2022 වසරේදී රට තුළට සෘජු විදේශ ආයෝජන ගලනය සිදුකළ ප්‍රධාන රටවල්



2022 වසරේ දේශීය ආයෝජන

2022 වසරේ ජන.-දෙසැ. දක්වා කාලය සඳහා සිදුකරන ලද දේශීය ආයෝජනවල එකතුව ඇ.ඩො. මිලි. 629කි. මෙම මුළු දේශීය ආයෝජනයෙන් වැඩිම ප්‍රමාණය නිෂ්පාදන අංශය (35%) සඳහා ලැබී ඇති අතර ඉන්පසු දේපළ සංවර්ධන අංශය (29%), දුරකථන සන්නිවේදන අංශය (11%), සංචාරක හා විවේක (9%), වරාය සංවර්ධනය (5%) සහ වෙනත් සේවාවන් (6%) වේ.






2022 වසරේ අපනයනය

2022 වසරේ ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන්ගේ අපනයන එකතුව ඇ.ඩො. මිලි. 9,428ක් ලෙස වාර්තා විය (වෙළඳ භාණ්ඩ අපනයනයෙන් ඇ.ඩො. මිලි. 8,703 සහ සේවා අපනයනයෙන් ඇ.ඩො. මිලි. 725). ආයෝජන මණ්ඩල වෙළඳ භාණ්ඩ අපනයනයන්, ජාතික වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 66% ක් හා ජාතික කාර්මික අපනයනයෙන් 80%ක් සඳහා දායක වේ.


සමස්ථ ආයෝජන මණ්ඩල අපනයනයෙන් 89%ක් කාර්මික අපනයනයන් වන අතර 8% සේවා අංශයද 3%ක් කෘෂිකාර්මික අංශයද දායකවී ඇත.

2022 වසරේ ආයෝජන මණ්ඩලයේ අපනයන සංයුතිය



ආයෝජන මණ්ඩලයේ මුළු කාර්මික අපනයනයෙන් 69%ක් ඇඟළුම් හා රෙදිපිළි අංශයෙන්ද 11%ක් රබර් අංශයෙන්ද, 6%ක් යන්ත්‍ර හා යාන්ත්‍රික උපාංග අංශයෙන් සහ 2%ක් ආහාර, පාන වර්ග හා දුම්කොළ අංශයෙන් ද ලැබී ඇත.


ආයෝජන මණ්ඩල සමාගම්වල කාර්මික අපනයනයන් (ඇ.ඩො. මිලි.) - 2022



රැකියා උත්පාදනය

2022 වසරේ වාර්තාවූ රැකියා උත්පාදනය 505,844කි. ඇඟළුම් හා රෙදිපිළි ආශ්‍රිත අංශය සමස්ත රැකියා සංඛ්‍යාව සඳහා වැඩිම දායකත්වයක් (62%) ලබාදී ඇත. අනෙකුත් නිෂ්පාදන අංශය (13%), තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය (5%), අනෙකුත් සේවාවන් (3%), සංචාරක හා විවේක (3%), දේපළ සංවර්ධන (2%) සහ දුරකථන සන්නිවේදන අංශය (2%)ක් වශයෙන් අනෙකුත් අංශ මේ සඳහා දායක වී ඇත.

ආංශික වශයෙන් රැකියා ව්‍යාප්තිය





ශ්‍රී ලංකාව සෘජු විදේශ ආයෝජන සඳහා ආකර්ෂණීය ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම

සෘජු විදේශ ආයෝජන සඳහා ආකර්ෂණීය ගමනාන්තයක් ලෙස

- **නිරතවූ ක්‍රියාකාරකම්**

8	මාර්ගගත සම්මන්ත්‍රණ (Webinars)
3	පහසුකම් සැළසීමේ වැඩසටහන්
37	මාර්ගගත / භෞතික සාකච්ඡා
8	කොළඹ සිටින විදේශ දූත මණ්ඩල සමග රැස්වීම්
15	දූත මණ්ඩල / ව්‍යාපාරික සංසද
121	විමසීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම්
15	IFC සම්බන්ධයෙන් කටයුතු කිරීම්

- **හඳුනාගත් මුළු ආයෝජකයින් 1300**
- **මාර්ගගතව සම්බන්ධ වූ මුළු සංඛ්‍යාව**

1007	ලියාපදිංචි වූ සංඛ්‍යාව
602	සත්‍ය වශයෙන් සහභාගි වූ සංඛ්‍යාව



මාධ්‍ය භාවිතය

16,000+ followers	2,300+ followers	800+ followers

සමාජ මාධ්‍ය භාවිතා කරන්නන් - 19,175

FOLLOW

New followers in 2022 - 10,230

Impressions 328,954

Profile visits 100,729

පළ කරන දෑ

- ආයෝජන ගිවිසුම් අත්සන් කිරීම
- අපනයනයන් සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ අංශික කාර්යසාධනය
- කලාප සහ කර්මාන්තශාලා නිරීක්ෂණ චාරිකා සහ අදාල ක්‍රියාකාරකම්
- ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් සහභාගි වන වැඩමුළු, සමුළු සහ ක්‍රියාකාරකම්
- ආයෝජන මණ්ඩලයේ අනුමත කර්මාන්තශාලා විවෘත කිරීමේ උත්සව
- නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත සංවර්ධන ව්‍යාපෘති
- තානාපතිවරුන් ඇතුළු විශේෂ අමුත්තන් විසින් ආයෝජන මණ්ඩලය වෙත කරන සංචාරයන්
- පාර්ශවකරුවන් සමග පවත්වන වැදගත් රැස්වීම්

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය සඳහා වන ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛ නියෝජිතායතය වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පරිශීලක නාමය @BOIsrilanka සිට @ Investin_SL ලෙස වෙනස්කර ඇත.

විශේෂ හඳුන්වාදීම්

- එක් දිනකදී tweets දෙකක් පළකිරීම
- ආයෝජන මණ්ඩල වෙබ් අඩවියේ පහළින් Twitter timeline ඇතුළත් කිරීම.
- #InvestinSL නමින් නව hashtag එකක් හඳුන්වා දෙනු ලැබිය.
- වීඩියෝ සහිත tweeting ආරම්භ කරන ලදී.

විශිෂ්ටතා සම්මාන



රජත සම්මානය

2022 AIM සම්මාන උළෙලේ රජත සම්මානය හිමිකර ගැනීම

දකුණු ආසියාවේ ප්‍රධාන ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතන වලින් එකක් වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, වාර්ෂික ආයෝජන රැස්වීමේදී (AIM) දකුණු, නැගෙනහිර සහ ඕෂනියා කලාපයේ දෙවන හොඳම ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනය සඳහා වන රජත සම්මානය දිනාගනු ලැබීය.

AIM සම්මාන මගින් ප්‍රමාණවත් ප්‍රතිලාභී ආයෝජන ව්‍යාපෘති ආකර්ෂණය කරගැනීමේදී එක් එක් රටෙහි නිපුණතාවය සහ අදාල රටෙහි ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සඳහා ඔවුන්ගේ දායකත්වය ග්‍රහණය කරගැනීම ඉලක්ක කෙරේ.

AIM විසින් සංවිධානය කරනලද සම්මාන ප්‍රදානෝත්සවය 2022 මාර්තු මස 29 වන දින ඩුබායිහි අමානි හෝටලයේදී පැවැත්වූ අතර එහිදී ඩුබායි හා උතුරු එමිරේට්ස්හි ශ්‍රී ලංකා කන්සියුලර් ජෙනරාල් කාර්යාලය විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කරනු ලැබීය.





නිදහස් කලාප සම්මාන උළෙල

fDi Intelligence Free Zone Awards සම්මාන 2022

ආයෝජන මණ්ඩලය යටතේ පාලනය **වන කටුනායක අපනයන** සැකසුම් **කලාපය එහි ප්‍රතිආයෝජන** උපායමාර්ග **සඳහා fDi Intelligence's Free Zones** Awards **සම්මාන උළෙලේදී ඇගයීම**

කටුනායක පිහිටි ශ්‍රී ලංකාවේ විශාලම අපනයන සැකසුම් කලාපය එහි ප්‍රතිආයෝජන උපායමාර්ග සඳහා 2022 fDi Intelligence Free Zone Awards සම්මාන උළෙලේදී විශේෂ ගෞරව සම්මානයක් හිමිකර ගනු ලැබීය. එක්සත් රාජධානිය පදනම් කරගත් 2022 fDi Intelligence Free Zone Awards සම්මාන උළෙලේදී ලොවපුරා පිහිටි වඩාත් සාර්ථක සහ ව්‍යාපාර පුළුල් කිරීම හා ආර්ථික වර්ධනය සඳහාවන හොඳම ආයෝජන පරිසරයන් පිරිනමන ආයෝජන කලාප ඇගයීමට ලක්කරන ලද අතර Financial Times කර්තෘ මණ්ඩලය සහ කලාපයේ ස්වාධීන විශේෂඥයින්ගෙන් සමන්විත මණ්ඩලයක් මගින් එය විනිශ්චය කරන ලදී.

දැනට පවත්නා ආයෝජන මණ්ඩල ව්‍යාවසායයන්හි ධාරිතාව සහ ඵලදායිතාවය වැඩිකිරීම, වර්ධනය, විවිධාංගිකරණය කිරීම සහ පුළුල් කිරීමේ ප්‍රයත්නයන් ලෙස නව ආයෝජන ව්‍යාපාර සංස්ථාගත කිරීම සඳහා සහය දීම මගින් සෘජු විදේශ ආයෝජන ගලනයන් වැඩිකිරීම සඳහා ප්‍රතිආයෝජන උපායමාර්ග ආරම්භ කරන ලදී. සම්මාන ප්‍රදානය සිදුකරන දිනය වනවිට ආයෝජන කලාපයේ මහා පරිමාණ ව්‍යවසායයන් 33න් 4ක්ම ඇ.ඩො.මිලි. 26.5ක අයෝජනයක් ආරම්භකර ඇති අතර එමඟින් රැකියා අවස්ථා 1000ක් පමණ බිහිවනු ඇති බවට ඇස්තමේන්තු කර ඇත.



වැදගත් සිදුවීම්





ආයෝජක පහසුකම් සැළසීමේ මධ්‍යස්ථානය IFC

ආයෝජක පහසුකම් සැළසීමේ මධ්‍යස්ථානය (IFC) ආරම්භ කිරීම

ආයෝජන ප්‍රවර්ධනය වේගවත් කිරීම සහ ඒ සඳහා පහසුකම් සැළසීමේ ආයතනය වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ආයෝජක පහසුකම් සැළසීමේ මධ්‍යස්ථානය (IFC) ආරම්භ කරන ලදී. එමඟින්, ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය ක්‍රමවත් කරන අතර ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කරමින් ආයෝජකයින් සඳහා කාර්යක්ෂම සහ කඩිනම් සේවාවක් සැපයීම සිදුකරනු ලැබේ. මේ සඳහා ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බටහිර කුළුණේ 27 වන මහලේ ප්‍රමාණවත් ඉඩක් වෙන්කර ඇත.

ආයෝජකයින් මුහුණදෙන අනවශ්‍ය ප්‍රමාදයන් වලක්වමින් ඔවුන්ගේ විශ්වාසය තහවුරු කිරීම මෙම IFC හි අපේක්ෂාව වේ.

රැස්වීම් ශාලා, තොරතුරු සහ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කවුළු වැනි අත්‍යවශ්‍ය අංගයන්ගෙන් සමන්විතවන නවීන ව්‍යාපාර පහසුකරණ මධ්‍යස්ථානයක් තුළ ආයෝජකයින්ට සුව පහසු අයුරින් කටයුතු කිරීමට හැකි ලෙස මනාව සංවිධානයකර මෙම IFC ස්ථාපිත කර ඇත.

2022 ඔක්තෝබර් 20 වන දින ගරු ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම මහතා විසින් IFC විවෘත කරන ලදී.



හවුල්කාරිත්ව සෙවුම් ද්වාරය

ආයෝජන ආකර්ෂණය කිරීම සඳහා වන "Partnership Finder" Platform

රටේ දැනට සිටින ආයෝජකයින්ගෙන් ආයෝජන ආකර්ෂණය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් නව උපායමාර්ගික අරම්භයක් වන හවුල්කාරිත්ව සෙවුම් ද්වාරය "Partnership Finder" (PF) හඳුන්වා දෙනු ලැබීය. මෙම අන්තර්ක්‍රියාකාරී සෙවුම් ද්වාරය මගින් ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ආයෝජකයින් සහ අනෙකුත් විභව්‍ය ආයෝජකයින්ට නව ව්‍යවසායකයින් සහ නව අදහස් ඇති නවෝත්පාදකයින් සමග සම්බන්ධවීම සඳහා සුදුසු ඉඩප්‍රස්ථාව සළසවන ලදී.

මෙය දේශීය මෙන්ම විදේශීය සමාගම් සම්බන්ධීකරණ ජාලයක් ලෙස ක්‍රියාත්මක වනු ඇති අතර සුදුසු හවුල්කරු සොයාදීම මගින් ව්‍යාපාර, පර්යේෂණ ආයතන, සහ ව්‍යාපාර ආරම්භ කරන්නන් සඳහා ඔවුන්ගේ ඊළඟ නවෝත්පාදනය හෝ ව්‍යාපාරය සඳහා උපකාර කිරීම අරමුණු කෙරේ. කෘෂිකර්මාන්තය, ඇඟළුම්, යටිතල පහසුකම්, දැනුම් සේවාවන්, නිෂ්පාදන, සේවාවන්, සංචාරක සහ විවේක, සහ උපයෝගීතාවන් වශයෙන් ව්‍යාපාර කාණ්ඩය අනුව සමාගමේ විස්තර දත්ත ගබඩාවක ඇතුලත් වනු ඇත.

මෙහි ලියාපදිංචි වී ඇති සමාගම්වලට ඔවුන්ගේ විස්තරවල ඇතුලත් සම්බන්ධවීමේ තොරතුරු භාවිතා කර අනෙකුත් සමාගම් / ආයෝජකයින් සමග සෘජුවම සම්බන්ධවීමේ අවස්ථාව සැලසේ.

වැදගත් සිදුවීම්



දිගුකාලීන නේවාසික වීසා

ආයෝජකයින් සඳහා දිගුකාලීන නේවාසික වීසා වැඩසටහන හඳුන්වා දීම

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ආයෝජකයින්, පාර්ශවකරුවන් සහ ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් සඳහා වසර පහක නේවාසික වීසා වැඩසටහනක් ආරම්භ කරනු ලැබීය. ආයෝජකයින් සඳහා දිගු කාලීන වීසා නිකුත් කිරීම ව්‍යාපාර පහසු කිරීම (Ease of Doing Business) සඳහා වන ජාත්‍යන්තර මිණුම් ප්‍රමිතින් හා ගැළපේ. ශ්‍රී ලංකාවේ සිය මෙහෙයුම් සිදුකරන අතරම අයෝජකයින් සඳහා වඩාත් හොඳින් පහසුකම් සැළසීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් මෙම වැඩසටහන දියත් කරන ලදී. දීර්ඝ කාලයක් තිස්සේ අවශ්‍යතාවයක්ව පැවති මෙම දිගු කාලීන වීසා වැඩසටහන ආයෝජක ප්‍රජාව විසින් සාදරයෙන් පිළිගනු ලැබ ඇත.

ගරු ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ධම්මික පෙරේරා මැතිතුමා විසින් 2022 ජූලි 4 දින මෙම වැඩසටහන ආරම්භ කරනු ලැබීය.



වීසා සඳහා පහසුකම් සැළසීම

ඩිජිටල් පරිවර්තනය වේගවත් කරමින් මාර්ගගත වීසා නිර්දේශ කිරීමේ පද්ධතිය

ව්‍යාපාර පහසු කිරීම (Ease of Doing Business) වැඩිදියුණු කිරීමේ සහ ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීමේ අරමුණ ඇතිව, ශ්‍රී ලංකාවට පැමිණෙන විභව්‍ය ආයෝජකයින් සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ගැනෙන සියලු ව්‍යවසායයන් වෙනුවෙන් මාර්ගගත වීසා නිර්දේශ කිරීම සඳහා ආයෝජන මණ්ඩලය ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ ආරක්ෂක අමාත්‍යාංශය සමගින් වීසා නිර්දේශ කිරීමේ ක්‍රමවේදයක් ආරම්භ කරනු ලැබීය.

මෙම නව වීසා නිර්දේශ කිරීමේ ක්‍රමය මගින් රටට ඇතුල්වීමේ වීසා, නේවාසික වීසා, සහ වීසා දීර්ඝ කිරීම යන විසා කාණ්ඩ තුනක් යටතේ වීසා නිර්දේශ කිරීම් සිදුකෙරේ. ඊට අමතරව ආයෝජකයින්, සේවකයින් සහ ආයෝජකයින්ගේ යැපෙන්නන් මෙන්ම තෝරාගත් සේවකයින් මේ යටතේ වීසා සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබනු ඇත.

ආයෝජකයින් භෞතිකව ආයෝජන මණ්ඩලයෙහි පෙනී සිටීම අවශ්‍ය නොවන බැවින් ඔවුන්ගේ වේලාව ඉතිරිවීම මෙම නව ක්‍රමය මගින් ආයෝජකයින් / ව්‍යවසායයන් ලබාගන්නා ප්‍රධාන ප්‍රතිලාභ වලින් එකක් වේ. එසේම ආයෝජකයින්ට මාර්ගගත පෝටලය අධීක්ෂණය කිරීමට සහ ක්‍රියාවලියේ තත්ත්වය සමාලෝචනය කිරීමට හැකිවේ.

ක්‍රියාවලිය නිමවූ පසුව අයදුම්කරුවන්ට කෙටි පණිවුඩයක් සහ විද්‍යුත් තැපෑල ඔස්සේ ඒ බව දැනුම්දේ. එවිට අයදුම්කරුවන්ට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත පැමිණ වීසා ලබාගත හැකිය.



ආයෝජකයින් සමග සම්බන්ධතාවය



මාර්ගගත සම්මන්ත්‍රණ (Webinars)

ශ්‍රී ලංකාව සඳහා විභව්‍ය ආයෝජන අවස්ථා ඉලක්ක කිරීම.

2022 වසරේදී මෙරටට නව ආයෝජකයින් ආකර්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති විභව්‍ය ආයෝජන අවස්ථා පිළිබඳව දැනුවත්බව ඇතිකිරීම අරමුණු කරගෙන මාර්ගගත සම්මන්ත්‍රණ මාලාවක් දියත් කරනු ලැබීය.

අසීරු කාල පරිච්ඡේද වලදී නව ආයෝජන අවස්ථාවන් සඳහා ඉඩ සැලසෙන බව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හඳුනාගෙන තිබේ. එබැවින්, රටට නව ආයෝජන ගෙන ඒමේ කෙන්ද්‍රස්ථානය බවට පත්වීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නිසි මාර්ගයේ අඛණ්ඩව ඉදිරියට යන බව තහවුරුකර ඇත.

ආයෝජකයින්ට ලබාදෙන සේවාවන් ක්‍රමවත් කිරීම සඳහා ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බටහිර කුළුණෙහි 27 වන මහලේ මෑතකදී ස්ථාපනය කරන ලද ආයෝජක පහසුකම් සැළසීමේ මධ්‍යස්ථානය (IFC) පිළිබඳව ආයෝජකයින් දැනුවත් කිරීම සඳහා ද මෙම වෙබිනාර් මාලාව මගින් වේදිකාවක් සැපයේ.



යුරෝපා සංගමය - ශ්‍රී ලංකා

යුරෝපා සංගමය - ශ්‍රී ලංකා ආයෝජක සංවාදය (පහසුකම් සැළසීමේ සංසදය)

මුදල් අමාත්‍යාංශය සහ යුරෝපා සංගමයේ දූත කණ්ඩායම අතර කොළඹදී පැවති ශ්‍රී ලංකා - යුරෝපා සංගම ආයෝජක සංවාදයේදී ආයෝජන මණ්ඩලය ප්‍රධාන හවුල්කරුවකු විය. පවත්නා ආර්ථික තත්ත්වය, විදේශ විනිමය හා අදාල අභියෝග, ආයෝජන හා බදුකරණය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය සංගතභාවය සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක අවශ්‍යතාවය මෙහිදී විශේෂයෙන් සළකා බලන ලද මූලික කරුණු වේ. ශ්‍රී ලංකාව ප්‍රවාහන සහ සේවා සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කිරීම, මෙරට යුරෝපා සංගමයේ ආයෝජන වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවන් ප්‍රවර්ධනය කිරීම සහ සෞඛ්‍යය අංශය නවීකරණය කිරීම මෙහිදී අන්‍යෝන්‍ය වශයෙන් අවධානය යොමුකරන ලද මූලික කරුණු වේ.

2014 වසරේ අරම්භ වූ ශ්‍රී ලංකා - යුරෝපා සංගමය අතර ආයෝජක සංවාදය මගින් යුරෝපා සංගමයේ දැනට සිටින ආයෝජකයින් සඳහා සිය සමාගම් මුහුණ දෙන ගැටළු සම්බන්ධයෙන් විසඳුම් ලබාගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සමග සාකච්ඡා කිරීම සඳහා ඵලදායි වේදිකාවක් සැපයේ.



ශ්‍රී ලංකාව සහ AHK

ආයෝජන මණ්ඩලය හා AHK ආයෝජක පහසුකම් සැළසීමේ රැස්වීම - කටුනායක අ.සැ.ක. (KEPZ)

ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකාවේ ජර්මානු කර්මාන්ත හා වාණිජ මණ්ඩලයේ (AHK) සහයෝගීතාවය ඇතිව කටුනායක අපනයන සැකසුම් කලාපයේදී ආයෝජකයින් සඳහා පහසුකම් සැළසීමේ රැස්වීමක් පවත්වනු ලැබීය. කොන්ටිනෙන්ටල් ටයර්, KRAMSKI ලංකා, ලංකා ලෙදර්, කොකෝ ලංකා, ලංකා ඩයිනමික්ස් සහ එස්කිමෝ ඇපරල් ඇතුලුව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ප්‍රමුඛ ජර්මානු සමාගම්වල ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය මේ සඳහා සහභාගි විය. ජර්මානු ආයෝජක බැඳීම දීර්ඝ කාලයක් පුරා ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවල යෙදෙමින් මෙරට සෘජු විදේශ ආයෝජන උරුමයේ "පෙර ගමන්කරුවන්" ("First Movers") යන සාඩම්බරත්වය හිමිකර ගෙන ඇත.

ආයෝජන සිදුකිරීමේදී රටවල් දෙකෙහිම ඒකමතිකත්වය සොයාබැලීම, දැනට සිටින ආයෝජකයින් සඳහා ශ්‍රී ලංකාව සමග ව්‍යාපාර කිරීම සහ ශ්‍රී ලංකාවේ ජර්මානු ආයෝජනයේ ඉදිරි ගමන පිළිබඳව නැවත සළකා බැලීම මෙම රැස්වීමේ මූලික අරමුණු විය.

ආයෝජකයින්ගේ අදහස්



එලිගන්ට් නිටින් (ElegantKnitting)

අපනයන සැකසුම් කලාපය, බියගම

ඉතා උසස් සහ තාක්ෂණික වශයෙන් සංකීර්ණ උපකරණ අප ආයතනය සතුවේ. නිපුණතාවයෙන් යුත් ශ්‍රමබලකායක් සමග කටයුතු කිරීමට හැකිවීම පිළිබඳව මම ඉතා සතුටු වෙමි. ඉතා දක්ෂ, ඉංග්‍රීසි කථාකළ හැකි මෙන්ම පුහුණු කළ හැකි ශ්‍රම බලකායක් ශ්‍රී ලංකාව සතුවේ. මට ඔවුන් අප ව්‍යාපාරය සඳහා හොඳින් පුහුණු කිරීමට හැකිව තිබේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රජය මගින් ලැබෙන සහය සතුටුදායක වේ. කොවිඩ් - 19 වසංගතය පැවති කාලය පුරා අඛණ්ඩව මෙහෙයුම් කටයුතු සහ අපනයනයන් සිදුකිරීමට හැකිවන අයුරින් අපට පහසුකම් රැසක් ලබාදෙනු ලැබීය. අප මුහුණ දෙමින් සිටින මූල්‍ය අර්බුදය හමුවේ වුවද අපගේ මෙහෙයුම් සහ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යාම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අපට විශාල වශයෙන් පහසුකම් සළසනු ලැබේ.

ලුක් හොල්මික් මහතා

අධ්‍යක්ෂ



ඕෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

අපනයන සැකසුම් කලාපය, බියගම

අප වික්ටෝරියාස් සීක්‍රට්, මාර්ක්ස් ඇන්ඩ් ස්පෙන්සර්, නෙක්ස්ට්, නයිකි, යුනිකෝන් සහ පුමා වැනි සන්නාම සඳහා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, යුරෝපය, කැනඩාව, සහ ඔස්ට්‍රේලියාව සමග අඛණ්ඩව ව්‍යාපාරික කටයුතුවල යෙදෙන්නෙමු. මේ සියලු සමාගම් අපගේ ප්‍රධාන ගනුදෙනුකරුවන් වේ.

ඉතා සුළුවෙන් ආරම්භ කර මේ දක්වා වැඩිදියුණු වීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයලබාදුන් සහය සම්බන්ධයෙන් අපි ඉතා සතුටු වන්නෙමු.

ආචාර්ය ඔස්ටින් CK Au

කළමනාකාර අධ්‍යක්ෂ



ෂැන්ග්‍රීලා හෝටලය

භූ දර්ශන, වනජීවීන්, ඉතිහාසය සහ සංස්කෘතික වශයෙන් ශ්‍රී ලංකාවේ ඇති විවිධත්වය සැලකූ විට ශ්‍රී ලංකාව කොතරම් සුවිශේෂීදැයි ඉදිරි වසරේදී මිනිසුන් වැඩි වැඩියෙන් තේරුම්ගනු ඇති බව මාගේ විශ්වාසයයි.

හර්වූ ඩුබස්කෝ මහතා

සාමාන්‍යාධිකාරී



Weligama Beach Marriot Resort and Spa

ශ්‍රී ලංකාව සතුව පිරිනැමීමට බොහෝ දේ ඇති අතර මෙරට සතුව පවතින දායාදයන් සම්බන්ධයෙන් මම ඉතා ධනාත්මක වෙමි. මෙරට පවතින අවස්ථාවන් සැළකුවිට ඇත්ත වශයෙන්ම එහි සීමාව අහස දක්වා වේ. එහි කිරීමට එතරම් දේවල් ඇත.

පියුෂ් ටුඅාගි මහතා

සාමාන්‍යාධිකාරී



GAC Group

අපනයන සැකසුම් කලාපය, බියගම

ශ්‍රී ලංකාවේ සමුද්‍රීය සේවා සැපයුම, නැව්ගත කිරීම්, සහ නාවුක කර්මාන්තය තවමත් ඉතා ළදරු අවධියේ පවතී. එබැවින් මෙම කර්මාන්තය තවදුරටත් වර්ධනය සහ වැඩිදියුණු කළ යුතු වේ. අනාගත ආයෝජකයින්ට මෙම කර්මාන්තයේ ආයෝජනය කරන ලෙස ආරාධනා කරමි,මන්දයත් ඔබගේ ප්‍රවේශය සහ තීරණගැනීමේ ක්‍රියාවලිය උපායමාර්ගික නම් ඔබට බොහෝ වාසි අත්වනු ඇත. ශ්‍රී ලංකාවටද මෙම කර්මාන්තය මගින් සාම්ප්‍රදායික මාර්ගවලින් මිදී විදේශ විනිමය ඉපයීමට හැකිවනු ඇත.

රවි එදිරිසිංහ මහතා

අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී



HCL ටෙක්නොලොජීස් ලංකා

තොරතුරු තාක්ෂණ විසඳුම් ලබාදෙන ජාත්‍යන්තර සමාගමක් වන HCL ලොවපුරා රටවල් 52ක සිය මෙහෙයුම් කටයුතු සිදුකරන අතර එහි 208,000ක් පමණ පිරිසක් සේවයේ යෙදි සිටී.

ශ්‍රී ලංකාව සතුව සුවිශේෂී හැකියාවන් පවතින අතර එමඟින් අප සමාගමට ලොවපුරා ප්‍රමුඛ සමාගම් පන්සීයකට (Fortune Five Hundred Companies) සේවය සැපයීමට අපට හැකිවී තිබේ. ලොව වටා විසිරී සිටින ජාත්‍යන්තර ගනුදෙනුකරුවන්ට සහයවෙමින් අප සමාගම යටතේ කොළඹ සේවය කරන තොරතුරු තාක්ෂණ අංශයේ සේවකයින් සංඛ්‍යාව 2000ක් වේ.

අපගේ අත්දැකීම් මත පදනම්ව ශ්‍රී ලංකාවේ ඇති ආයෝජන අවස්ථාවන් ගවේෂණය කිරීම සඳහා අනෙකුත් සියලු ගෝලීය ආයෝකයින්ට ආරාධනා කරන අතර අප වෙත ලබාදුන් සහය වෙනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට සහ රජයේ ආයතනවලට බෙහෙවින් ස්තුතිවන්ත වෙමු.

තොතත්‍රි මහතා

නේවාසික අධ්‍යක්ෂ සහ මධ්‍යස්ථාන ප්‍රධානී

ජාත්‍යන්තර හවුල්කරුවන් සමග කටයුතු කිරීම



SDG ආයෝජන සිතියම

ශ්‍රී ලංකාව සඳහා SDG ආයෝජන සිතියම වෙනුවෙන් UNDP, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහයෝගිතාව

ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) රජය සමග එක්ව රටේ තිරසර සංවර්ධන ඉලක්ක සඳහා රජයේ ප්‍රතිපත්ති සහ වෙළඳපළ අවස්ථා අතිශේදනය කරන අංශ කරා පෞද්ගලික ප්‍රාග්ධනය යොමුකරන වෙළඳපළ මෙවලමක් වන ශ්‍රී ලංකා SDG අයෝජන සිතියම දියත් කරන ලදී.

මෙම සිතියම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ලංකා වාණිජ මණ්ඩලය සහ ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම, පහසුකම් සැළසීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම සඳහා වගකියන රජයේ ප්‍රමුඛ ආයතනය වන තිරසර සංවර්ධන කවුන්සිලය අතර සහයෝගීතාවයක ප්‍රතිඵලයක් වේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මෙම සැලසුම සකස් කරන අවස්ථාවේදී ඒ සඳහා අවශ්‍ය තොරතුරු සහ සහාභාගිත්වය මෙන්ම වලංගු භාවය ලබාදෙනු ලැබීය. ද්විතීයික පර්යේෂණ සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සමග පැවැත්වූ සාකච්ඡා 50ට වැඩි ගණනක් හරහා පුනර්ජනනීය බලශක්තිය, සෞඛ්‍යාරක්ෂාව, යටිතල පහසුකම්, ආහාර හා පානවර්ග සහ පාරිභෝගික ද්‍රව්‍ය යන තිරසර සංවර්ධන ඉලක්කයන්හි ප්‍රමුඛ අංශ පහක් හරහා තේමාගත හා ව්‍යාපාරික ආකෘති ආවරණය කරන ආයෝජන අවස්ථා ඇති ක්ෂේත්‍ර 15ක් හඳුනාගෙන ඇත.

ඉහළ මට්ටමේ ආයෝජන පහසුකම් සැළසීම

ආසියානු සහ ශාන්තිකර කලාපීය රටවල් ප්‍රතිලාභ ලබාගත් ආකාරය

ආසියා සහ ශාන්තිකර රටවල් සඳහා එක්සත් ජාතීන්ගෙ ආර්ථික සහ සමාජීය කොමිසම (ESCAP) ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) අග්නිදිග ආසියානු රටවල් සංවිධානය (ASEAN) ජර්මානු සංවර්ධන ආයතනය / DeutschesInstitut für Entwicklungspolitik (DIE) සහ ලෝක ආර්ථික සංසදය (WEF) එක්ව සංවිධානය කරන ලද සංවර්ධනය සඳහා ආයෝජන පහසුකම් සැළසීම පිළිබඳ ඉහළ මට්ටමේ කලාපීය වටමේස සාකච්ඡාව සඳහා සහභාගිවීමට සහ සිය අදහස් බෙදාගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරියට ආරාධනා කරනු ලැබීය. 2020 සැප්තැම්බර් 20 දින ආරම්භ කරන ලද මෙම වටමේස සාකච්ඡා මාලාව මගින් සංවර්ධන ගිවිසුම් සඳහා ආයෝජන පහසුකම් සැළසීම (IFD) සම්බන්ධයෙන් ලෝක වෙළඳ සංවිධානයේ (WTO) සාකච්ඡාවන් පිළිබඳව රාජ්‍ය නිලධාරීන් අතර උපායමාර්ගික දැනුම හුවමාරුවක් සඳහා වේදිකාවක් සකසනු ලැබීය.

ආසියා හා ශාන්තිකර රටවල් 24ක ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදකයින්, රාජ්‍ය නිලධාරීන්, පෞද්ගලික අංශයේ නියෝජිතයින්, සහ කීර්තිමත් විද්‍යාර්ථීන් සිය ගනුදෙනු පිළිබඳව යාවත්කාලීන කරමින් සහ ප්‍රගතිය පිළිබඳ දැනුවත්භාවය ඇතිකරමින් සහ සිය ව්‍යාපාරික වටපිටාව වැඩිදියුණු කිරීම, උසස් අගය එක්කළ ආයෝජන ආකර්ෂණය කිරීම සහ ආර්ථික වර්ධනය වැඩිදියුණු කිරීම, ඩිජිටල් ආර්ථික නවෝත්පාදන සහ තිරසර සංවර්ධනය සඳහා රටවල් සෘජු විදේශ ආයෝජන ගිවිසුම් ප්‍රශස්ත ලෙස භාවිතා කරන්නේ කෙසේද යන්න පිලිබිඹු කරමින් මෙම වටමේස සාකච්ඡාව පැවැත්විය.

මෙම පිළිබිඹු කිරීමේ ක්‍රියාවලිය මගින් සහභාගිවූවන්ට ඔවුන්ගේ තිරසර සංවර්ධන ඉලක්කයන්ට (SDG) සහ ජාතික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයන්ට අනුකූලව සිය රටවල ජාත්‍යන්තර සම්බන්ධතා තහවුරු කරගැනීම සඳහා උපකාර කිරීමටද අපේක්ෂිතය.



කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය



ආයතනික උපායමාර්ග (CORPORATE STRATEGY)

2022 - 2026 ආයතනික උපායමාර්ග සකස් කිරීම

2022 වසරේදී මණ්ඩලය විසින් වැදගත් ආර්ථික වෙනසක් ඇතිකිරීම අරමුණු කරගත් වසර පහක ආයතනික උපායමාර්ග එළිදක්වනු ලැබීය. ආයතනික කාර්යයන් වඩාත් සාර්ථක කරගැනීම සඳහා 2022 - 2026 කාලය සඳහා ආයෝජන මණ්ඩලයේ උපායමාර්ගික අරමුණු, ප්‍රතිපත්ති, ඉලක්ක සහ මූලික කාර්යසාධන දර්ශක (KPIs)සඳහන්කර ඇත.

2026 වසරේදී රටතුළට ඉලක්කගත සෘජු විදේශ ආයෝජන ගලනයන් ලෙස ඇ.ඩො. බිලි. 3ද සමගින් සෘජු විදේශ ආයෝජනය 32%ක සංයුක්ත වාර්ෂික වර්ධන අනුපාතයක් (CAGR) ලබාදීමට ආයෝජන මණ්ඩලය අපේක්ෂා කරයි. මෙම අගය උපලබ්ධි වීම සඳහා ඇ.ඩො. බිලි. 5ක පමණ සෘජු විදේශ ආයෝජන ව්‍යාප්ති ප්‍රමාණයක් මෙරටට ලැබෙන බව තහවුරු කරගත යුතුය.

ආකර්ෂණීය ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් දැනට ආරම්භකර ඇති කාර්යයන් සමග ඉහත සංඛ්‍යා සමපාත වේ.

ආසියාවේ තිරසාර ආයෝජන සඳහා වඩාත්ම ආකර්ෂණීය ගමනාන්තය බවට ශ්‍රී ලංකාව පත්කිරීම යන සිය දැක්ම ලඟාකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කරනු ලැබේ. නව තාක්ෂණයන් සහ නවෝත්පාදන පැවරීම හරහා දැනුම සහ නිපුණතා වැඩිදියුණු කරන අතරම රටේ අපනයන පදනම මෙන්ම රැකියාවන්හි සංඛ්‍යාව සහ ගුණාත්මක බව යන දෙකම වැඩිදියුණු කළ හැකි ප්‍රමිතියෙන් යුත් ආයෝජන ආකර්ෂණය කිරීම සහ රඳවා ගැනීම සඳහා රටේ විභවතාවය වැඩිදියුණු කිරීමට කඩිනමින් ප්‍රතිචාර දැක්වීම වෙනුවෙන් සිය මෙහෙවර සකස්කර ඇත.



හැකියාවන් සවිමත් කිරීම

ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය PIM සමග එක්ව අනාගත නායකත්වය ශක්තිමත් කිරීම

ආයතනයේ ඊලඟ මට්ටමේ අනාගත පරම්පරාව බිහිකිරීමේ අභිප්‍රාය ඇතිව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ජාතියේ කළමනාකරණ මඟ පෙන්වන්නා වන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) සමග එක්ව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සඳහා සැලසුම් කරනලද උපායමාර්ගික නායකත්ව සංවර්ධන වැඩසටහනක් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සඳහා කළමනාකරණ සංවර්ධන වැඩසටහනක් ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබීය.

මෙම වැඩසටහනෙහි සමාරම්භක වැඩසටහන මෑතකදී PIM ශ්‍රවණාගාරයේදී පැවැත්වූ අතර ඊට ආයෝජන මණ්ඩලයේ ඉහළ කළමනාකාරිත්වය සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් 41ක් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් 30ක් සහභාගි විය.

ජ්‍යෙෂ්ඨ මට්ටමේ කාර්යයන් භාර ගැනීමට හැකිවන පරිදි නිලධාරීන්ගේ අන්තර්පුද්ගල, සංකල්පමය සහ තාක්ෂණික නිපුණතා සංවර්ධනය කිරීම මෙම වැඩසටහනෙහි අරමුණයි. තවද මෙවැනි වැඩසටහන් ඉදිරියේදී ද සංවිධානය කිරීමට අපේක්ෂා කෙරේ.



ව්‍යාපාර කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ඩිජිටල් පරිවර්තනය (Digitization)

ආයතනික හැකියාවන් සඳහා පහසුකම් සැළසීම

කොවිඩ් - 19 වසංගත කාලය තුළ භෞතිකව සේවයට පැමිණීම සීමාවූ බැවින් එයට හොඳම විසඳුම ලෙස ආයතනය තුළ ඩිජිටල් පරිවර්තනය පැන නැගී ආ අතර එමගින් ආයෝජන මණ්ඩලයේ කාර්යයන් සම්බන්ධයෙන් මේවන විටත් කැපීපෙනෙන දියුණුවක් ඇතිවී තිබේ. උදාහරණයක් ලෙස රේගු ප්‍රකාශ (CUSDECs) ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කිරීම වැනි වැනි කඩදාසි රහිත ආනයන අපනයන ලේඛණ ඉදිරිපත් කිරීම, මාර්ගගත ආනයන අපනයන කළමනාකරණ වෙබ් පෝටලය, ආනයන අපනයන සත්‍යාක්ෂණ ගාස්තු සහ ප්‍රාග්ධන භාණ්ඩ ආනයන සඳහා ස්වයංක්‍රීය පද්ධතියක්, ඩිජිටල් පරිවර්තන පද්ධතියක් හරහා ආනයන අපනයන සඳහා පහසුකම් සැළසීම මේ සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩලය මෑතකාලයේ ආරම්භ කරන ලද කාර්යයන්ගෙන් සමහරකි. මෙම ක්‍රියාවලිය ආරම්භ කිරීමත් සමග ආනයන අපනයන ක්‍රියාවලිය පහසුවී ඇත, විශේෂයෙන්ම නිෂ්පාදන අංශයේ සමාගම් වලට කාලය මෙන්ම පිරිවැය ඉතිරිකර ගැනීමට හැකිවිය. මෙම පද්ධතිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ආයෝජන ආරම්භ කිරීමට අපේක්ෂිත දේශීය මෙන්ම විදේශීය ව්‍යවසායයන් සඳහා විවෘත වේ. මෙහිදී කාලය හා පිරිවැය ඉතිරි කරමින් පද්ධතිය හරහා ඉලෙක්ට්‍රොනිකව රේගු ප්‍රකාශ (CUSDECs) අනුමත කරන බැවින් රේගු අනුනියෝජිතයින් (CHA) භෞතිකව පැමිණීම අවශ්‍ය නොවේ.

ආයෝජන කලාප සංවර්ධනය

ආයෝජන කලාප 15හි යටිතල පහසුකම් සංවර්ධනය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දිවයින පුරා පිහිටි ආයෝජන කලාප 15ක ආයෝජකයින් සඳහා පහසුකම් සලසනු ලැබේ. නව ආර්ථික, සාමාජීය, සහ අනෙකුත් අභියෝග සමගින් වුවද, 2022 වසර පුරා සියලු ආයෝජන කලාපයන් හි අඛණ්ඩ මෙහෙයුම් සඳහා පහසුකම් සැළසීමට ආයෝජන මණ්ඩලයට හැකිවිය.

ආයෝජන කලාප තුළ ආයෝජකයින්ට උපරිම සහය පවත්වා ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් දැනට ක්‍රියාත්මක සහ අළුතින් එක්වූ එරාවුර් හා හම්බන්තොට පිහිටි ආයෝජන කලාපයන්හි යටිතල පහසුකම් අඛණ්ඩව සංවර්ධනය කෙරේ. මෙම නව කලාපයන් විශේෂයෙන්ම රෙදිපිළි සහ ඖෂධ ආශ්‍රිත කර්මාන්තයන් හි ආයෝජකයන්ට පහසුකම් සැළසීම සඳහා වෙන්කර ඇත.


ආයෝජන කලාපයන්හි සාම්ප්‍රදායික යටිතල පහසුකම්වලට අමතරව ආයෝජන මණ්ඩලය විසින් එහි ව්‍යවසායයන්ගේ ඉන්ධන අවශ්‍යතාවන් සපුරාලීම සඳහා ඉන්ධන පිරවුම්හල් ඉදිකිරීම ආරම්භ කරනු ලැබීය. රටේ පැවති ඉන්ධන අර්බුදය නිසා ආරම්භවූ මෙමගින් නැවත එවන් තත්ත්වයක් ඇතිවුවහොත් එතරම් බලපෑමක් නොමැතිව ආයෝජන කලාපයන්හි මෙහෙයුම් අඛණ්ඩව සිදුකරගෙන යාමට හැකිවේ.

තවද, ආයෝජන මණ්ඩලයේ නව අරමුණු වලින් එකක් ලෙස 2022 වසරේදී අයෝජන මණ්ඩලයේ ආයෝජන කලාපයන් තුළ ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්ව (Natioally Determined Contribution - NDC) අරමුණු වලට අනුකූලව හරිත ප්‍රමිතීන් ස්ථාපනය කිරීම ආරම්භ කරනු ලැබීය. ඒ අනුව පළමු පියවර වශයෙන් කටුනායක හා වගවත්ත අපනයන සැකසුම් කලාප සහ මහනුවර කාර්මික උද්‍යානය හරිත කලාප බවට පරිවර්තනය කිරීම සඳහා තෝරාගනු ලැබ ඇති අතර මෙම හරිත කලාප ආරම්භ කිරීම සඳහා ශක්‍යතාවන් සහ ක්‍රමවේදයන් පිළිබඳව සලකා බැලේ.

ආයෝජන කලාපයේ කර්මාන්තශාලා සේවකයින්ගේ වැඩිවන ඉල්ලුම සලකාබලා කටුනායක අපනයන සැකසුම් කලාපයේ දිවාසුරුකුම් මධ්‍යස්ථාන සහිත ශිෂ්‍ය ඉගෙනුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේ කටයුතු සිදුකෙරිණ. මේ තුළින් රටේ ආර්ථිකය සඳහා වැදගත් වන කාන්තා සහභාගිත්වය වැඩිකර ගැනීමට කටුනායක අපනයන සැකසුම් කලාපයේ අපේක්ෂාව වේ.

ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම පිළිබඳව ගෙවතු වගාවන් පවත්වා ගැනීම දක්වා පුළුල්කළ හැකි දැනුමක් සහ අත්දැකීම් ලබාදීම අපේක්ෂා කෙරේ. මෙමගින් ගෙවතු වගාවන් පිළිබඳව මණ්ඩලයීය සේවකයින්ගේ සහභාගිත්වය ඇතිව ආයෝජන කලාපවල එළවළු වගාකිරීමේ වැඩසටහනක් ආරම්භ කරනු ලැබීය.

2022 වසර තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අයෝජන කලාප වෙත නව ආයෝජන ආකර්ෂණය කරගැනීමට හැකිවිය. දකුණු අසියාවේ විශාලතම සිමෙන්ති නිෂ්පාදන ආයතන වලින් එකක් වන ලංවා සංස්ථා සිමෙන්ති කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් 2022 වසරේ සිට වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලද විශේෂ ව්‍යාපෘතියකි.




ගෝලීය ආයෝජන ප්‍රවණතාවය 2022 - 2023

කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 වසරේදී වාර්තාවූ ගෝලීය සෘජු විදේශ ආයෝජනය තීව්‍ර ලෙස පහත වැටීමෙන් අනතුරුව 2021 වසරේ දී සවිමත්ව 64%කින් යථා තත්ත්වයට පත්වීමත්, 2022 වසරේ දී නැවත ඇ.ඩො. ට්‍රිලියන 1.3 දක්වා 12%ක හදිසි කඩා වැටීමත් සමගින් ගෝලීය සෘජු විදේශ ආයෝජනයේ අස්ථාවර ප්‍රවණතාවන් අඛණ්ඩව පැවතුණි. යුක්‍රේන යුද්ධය, ආහාර හා බලශක්ති මිල වැඩි වීම සහ රාජ්‍ය ණය සීඝ්‍රයෙන් ඉහළ යාම වැනි එකිනෙක සම්පාත වූ ගෝලීය අර්බුද නිසා 2022 වසරේදී සෘජු විදේශ ආයෝජනයේ පසුබැස්මක් ඇතිවිය.

සංවර්ධිත රටවල, ප්‍රධාන වශයෙන්ම යුරෝපීය සහ දකුණු ඇමරිකානු රටවල සෘජු විදේශ ආයෝජන ඇ.ඩො. බිලි. 378 දක්වා 37%කින් පහළ වැටුණු අතර බහුජාතික ව්‍යවසායයන්හි (MNEs) මූල්‍ය ගනුදෙනු මෙම අවනතියට විශාල වශයෙන් හේතු විය. කෙසේවුවද, ගෝලීය ආයෝජන ගලනය සඳහා 70%ක ප්‍රමාණයක් වාර්තා කරමින් සංවර්ධනය වන රටවල් කරා සෘජු විදේශ ආයෝජන ගලනය ඇ.ඩො. බිලි. 916 දක්වා 4% කින් වැඩි විය. අවම සංවර්ධනයක් සහිත රටවල් (LDCs) ද ගෝලීය සෘජු විදේශ ආයෝජනයෙන් 2%කට වඩා අඩු අගයක් වන ඇ.ඩො. බිලි. 22 දක්වා 16%කින් පහත වැටීමෙන් මෙම අඩු වීමේ ප්‍රවණතාවය අත්දකිනු ලැබීය.

01 රූපය : ගෝලීය සෘජු විදේශ ආයෝජන ගලනයන් 2020 - 2022 (ඇ.ඩො. බිලි.)




මූලාශ්‍රය : UNCTAD (ලෝක ආයෝජන වාර්තාව 2023)

සෘජු විදේශ ආයෝජනයේ වැඩිම කොටස සංවර්ධනය වන රටවලින් වාර්තා වුවද එය නැගීඑන විශාල රටවල් සුළු සංඛ්‍යාවක් කේන්ද්‍රකර ගනිමින් විෂම ලෙස බෙදී ගොස් ඇත.

2021 වසර හා සමානවම සෘජු විදේශ ආයෝජන අගයක් ආකර්ෂණය කර ගනිමින් (ඇ.ඩො. බිලි. 662) ආසියාව ගෝලීය සෘජු විදේශ ආයෝජනයේ 50%කට වැඩි ප්‍රමාණයක් සඳහා දායක විය. ඉන්දියාව සහ ASEAN සාමාජික රටවල් පිළිවෙලින් 10% සහ 5%ක වැඩි වීමක් සමගින් වඩාත්ම ප්‍රත්‍යස්ථ සෘජු විදේශ ආයෝජනලාභී රටවල් විය. ලෝකයේ දෙවන විශාල සෘජු විදේශ ආයෝජනලාභී රටවන චීනය ද සෘජු විදේශ ආයෝජනයේ 5%ක වැඩි වීමක් සටහන් කරන ලදී.


2021 වසරේ සාක්ෂාත් කළ තනි ගනුදෙනු සෘජු විදේශ ආයෝජන වැඩි වීම ද නොතකා අප්‍රිකාවේ සෘජු විදේශ ආයෝජන ඇ.ඩො. බිලි. 45ක් ලෙස සනිටුහන් කරමින් 2020 වසරට පෙර අගයට පෙරළා පැමිණියේය. කෙසේවුවද, බලශක්ති අංශය සඳහා නව විදේශ ආයෝජන ව්‍යාපෘති (Greenfield Projects) ස්ථාපනය කිරීමේ ව්‍යාපෘති 39%ක් ද ජාත්‍යන්තර ව්‍යාපෘති මූල්‍යයන කිරීම් 5%ක් ද සමගින් කලාපය තුළ වැඩිම වර්ධනය පෙන්නුම් කරන ලදී. ලතින් ඇමරිකානු සහ කැරිබියන් කලාපය ඇ.ඩො. බිලි. 208ක අගයකට ලඟා වෙමින් සිය වැඩිම සෘජු විදේශ ආයෝජන මට්ටම වාර්තා කරනු ලැබූ අතර එය පෙර වර්ෂය හා සැලකීමේ දී 51%ක වැඩිවීමකි. අමුද්‍රව්‍ය නිස්සාරණ කර්මාන්තයන්හි විදේශීය අනුබද්ධ ප්‍රතිආයෝජන ඉපයුම් වල වැඩිවීම මේ සඳහා විශාල වශයෙන් හේතු විය.



කර්මාන්තයන්හි පවතින ප්‍රවණතාවන් සැලකීමේ දී, යටිතල පහසුකම් සහ ව්‍යාපෘති ගෝලීය අගයදාම (Global Value Chaine - GVC) - අදාල වන කර්මාන්තයන්හි ව්‍යාපෘති සංඛ්‍යාව වැඩි වූ අතර බලශක්ති කර්මාන්තයන් ස්ථායි සංඛ්‍යාවක් පැවතිම සහ ඩිජිටල් ආර්ථික අංශයේ වර්ධනයේ අඩු වීමක් දක්නට ලැබිණි. කලාප සහ අංශ බොහොමයක වර්ධනය වූ නව විදේශ ආයෝජන ව්‍යාපෘති දැනුම් දීම් 2022දී 15% කින් වර්ධනය විය. සැපයුම්දාම ප්‍රතිව්‍යුහගත කිරීමේ අර්බුදයකට මුහුණ දුන් ඉලෙක්ට්‍රොනික්, රථවාහන සහ යාන්ත්‍රික කර්මාන්ත ඇතුලුව ගෝලීය අගයදාම (GVC) - අදාල වන කර්මාන්තයන්හි ව්‍යාපෘතීන්හි සංඛ්‍යාව මෙන්ම වටිනාකම් ද වැඩි විය. ගෝලීය චිප් හිඟයට පිළියමක් වශයෙන් දැනුම්දී ඇති විශාලම ව්‍යාපෘති පහෙන් තුනක්ම අර්ධ සන්නායක ක්ෂේත්‍රයේ ව්‍යාපෘති විය.


2021 වසරේ වාර්තාවූ 50%ක වර්ධනයට වඩා 8%ක අඩු වර්ධන අනුපාතයකින් වුවද 2022 වසරේදී සූර්ය බලය සහ සුළං බලය ඇතුලු පුනර්ජනනීය බලශක්ති උත්පාදනය, මෙන්ම ඒවායේ සැපයුම් ජාල ද අඛණ්ඩව වර්ධනය විය. 2021 සහ 2022 වසර වල අත්‍යවශ්‍ය බණිජ ද්‍රව්‍ය ක්ෂේත්‍රයේ දැනුම් දෙන ලද ව්‍යාපෘති සංඛ්‍යාව පසුගිය දශකයේ සාමාන්‍ය මට්ටමට වඩා දෙගුණයකටද වඩා වැඩිවිය. 2022 වසරේදී බැටරි නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘති ඇ.ඩො. බිලි. 100ක අගයක්ද ඉක්මවා තෙගුණයකින් වැඩිවිය. කෙසේවුවද, සංවර්ධනය වන රටවල් සුළු සංඛ්‍යාවක් කරා සැළකිය යුතු ආයෝජන ආකර්ෂණයක් සමගින් මෙම ආයෝජන ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපීය නිෂ්පාදන මධ්‍යස්ථාන වෙත කේන්ද්‍රගත විය.

02 රූපය : දැනුම් දී ඇති නව විදේශ ආයෝජන ව්‍යාපෘති, 2020 - 2022




මූලාශ්‍රය : UNCTAD (ලෝක ආයෝජන වාර්තාව 2023)

03 රූපය : තෝරාගත් කර්මාන්ත අනුව දැනුම් දී ඇති නව විදේශ ආයෝජන ව්‍යාපෘති, 2021-2022 (ඇ. ඩො. බිලි.) - වටිනාකම අනුව ප්‍රමුඛ කර්මාන්ත



මූලාශ්‍රය : UNCTAD (ලෝක ආයෝජන වාර්තාව 2023)



ඉදිරි දැක්ම



2020 වසරේ සිටම රටේ ආර්ථික වර්ධනයට සහ සංවර්ධනයට අහිතකර බලපෑම් එල්ලකළ කොරෝනා වසංගතය සමග ශ්‍රී ලංකාව අභියෝග ගණනාවකට මුහුණ දී ඇත. කෙසේවුවද, 2023 වසරේදී ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීමේ අපේක්ෂාවත් සමග ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 2022-2026 ආයතනික සැලසුමෙහි අපේක්ෂිත පරිදි 2023 වසර වනවිට ළඟාකරගත යුතු ඉලක්ක රාශියක් ඇත.

රට තුළට සෘජු විදේශ ආයෝජන ගලනයන්

2023 වසරේදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විවිධ ආකාරයේ අයෝජන ව්‍යාපෘති හරහා එන ආයෝජන සමඟින් රට තුලට ඇ.ඩො. බිලි. 1.3ක වටිනාකමකින් යුත් සෘජු විදේශ ආයෝජන (FDI) ආකර්ෂණය කරගැනීම ඉලක්ක කෙරේ.

රැකියා අවස්ථා

රැකියා උත්පාදනය සම්බන්ධයෙන් පෙර කාර්යසාධනය සහ ක්‍රියාත්මක කෙරෙමින් පවතින ව්‍යාපෘති සලකා බලා 2023 වසර වනවිට ආයෝජන මණ්ඩලයීය සමාගම් මගින් 560,000ක සමුච්චිත රැකියා සංඛ්‍යාවක් බිහි කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉලක්කය වේ.

අපනයන ඉපයීම්

පසුගිය වසරවල ප්‍රවණතාවන් සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අපනයන කාර්යසාධනය වැඩි කිරීමේ හැකියාවන් සමඟින් 2023 වසර වනවිට සිය වෙළඳ භාණ්ඩ අපනයනය ඇ.ඩො. මිලි. 10,400 දක්වා වැඩි කිරීමට ආයෝජන මණ්ඩලය අපේක්ෂා කරයි.

ආයෝජන සඳහා ඉඩම් උපයෝගීතාවය

2023 වසරේදී අක්කර 464ක අමතර ඉඩම් ප්‍රමාණයක් ආයෝජන සඳහා සංවර්ධනය කරනු ඇත.

ආයෝජන කලාප සංවර්ධනය සහ කළමනාකරණය

ආයෝජකයින් සඳහා සංවර්ධනය කරන ලද ඉඩම් හිඟ වීමේ ගැටළුවට විසඳුමක් වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2023 වසරේදී පහත සඳහන් අපනයන සැකසුම් කලාප සංවර්ධනය කිරීමේ කාර්යයන්හි නියලීමට සැලසුම් කෙරේ:

- බිංගිරිය අපනයන සැකසුම් කලාපය
- වගවත්ත කාර්මික කලාපය
- හම්බන්තොට නව ආයෝජන කලාප සංවර්ධනයන්
    1) ඖෂධ කලාපය - ආරබොක්ක
    2) ආරබොක්ක ආයෝජන කලාපය සංවර්ධනය කිරීම
    3) මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය
- එරාවුර් රෙදිපිළි නිෂ්පාදන කලාපය
- නැගෙනහිර පළාතේ නව ආයෝජන කලාප (ස්ථාන හඳුනාගත යුතුව ඇත)

මානව ප්‍රාග්ධනය

අප කාර්ය මණ්ඩලය

මහජන සේවය සම්භන්ධව දැඩි අවබෝධයකින් කටයුතු කරන අප කාර්ය මණ්ඩලය, ආයතනය සහ මෙරට ආර්ථික හා සමාජ සංවර්ධනය කරා රැගෙන යන ගමනේදී ඉතා වැදගත්වේ.

මෙම ජාතික වගකීම ඉටුකිරීම සඳහා අප කාර්ය මණ්ඩලයට නිරන්තරයෙන් වෘත්තීය සහ පෞද්ගලික සහය සලසනු ලැබේ.

රාජ්‍ය අංශයේ වඩාත් අභිමත ආයතනයන්ගෙන් එකක් වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 1978 වසරේ එහි ආරම්භයේ පටන්ම විවිධ ක්ෂේත්‍රයන්හි නිපුණ වූවන් සඳහා රැකියා අවස්ථා සලසාදී ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ජාත්‍යන්තරය හමුවේ රට ඉදිරියට ගෙනයාමේදී ආයෝජන මණ්ඩලයට ශක්තියක් වන විවිධාකාර කුසලතා සහිත නව දැක්මකින් යුත් කණ්ඩායමකින් සමන්විත වේ. ආයතනයේ ව්‍යුහය විවිධ හැකියාවන්ගෙන් යුත් සංචිතයක් නිර්මාණය කිරීමට හැකි අයුරින් සැකසී ඇත.

මානව සම්පත් ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තුළ මානව සම්පත් කළමනාකරණ ක්‍රියාමාර්ග විස්තීර්ණ ප්‍රතිපත්ති තුනක් මගින් පාලනයවේ. මෙම ප්‍රතිපත්ති මගින් එක් එක් කාර්යයන් යටතේ ආයෝජන මණ්ඩලය අනුගමනය කළයුතු යහ පැවතුම් සඳහා පදනම සැකසේ.

මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත

සෑම මහජන කාර්යයකදීම අවංකත්වය සහ විශ්වාසනීයත්වය තහවුරු කිරීම සඳහා මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත හඳුන්වාදී ඇත. තවද, මහජනයා කේන්ද්‍රකර සහ සියලු දෙනාට සාධාරණ ලෙස කටයුතු කරන බව එමගින් තහවුරු කෙරේ. එමගින් බඳවා ගැනීම් සහ තෝරාගැනීම, පරිවාසය හා සේවය ස්ථිර කිරීම, පාරිශ්‍රමික, වැඩකරන පැය ගණන, පැමිණීම හා නිවාඩු, කාර්යසාධනය ඇගයීම සහ පුහුණුව සහ සංවර්ධනය හා අදාල සියලු කාර්යයන් පාලනය කෙරේ. තවද මෙමගින් උසස්වීම්, මාරුවීම්, සේවයෙන් පහළ දැමීම්, වැඩ කිරීමේ කොන්දේසි, දුක්ගැනවිළි මෙන්ම සේවක සංගම් සම්බන්ධ කරුණු සම්බන්ධයෙන්ද මාර්ගෝපදේශ ලබාදේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව සාධාරණ අපගමනයක් සිදුවිය හැකි අවස්ථාවන්වලදී හැර අන් හැම විටම අප නිරන්තරයෙන්ම මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොතට අනුකූලව කටයුතු කරන්නෙමු.

බඳවා ගැනීමේ පටිපාටිය

අභ්‍යන්තරව හා බාහිරව අවශ්‍ය නිපුණතා සහිත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී දැඩිව අනුගමනය කළයුතු සහ සළකාබැලියයුතු මාර්ගෝපදේශ මෙම බඳවා ගැනීමේ පටිපාටිය මගින් පැහැදිලිව දක්වා ඇත.

විනය සංග්‍රහය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අප වෘත්තීයභාවය සහ සේවක ආචාරධර්ම දිරිමත් කරන්නෙමු. අප සෑමවිටම ආචාරධර්ම අනුගමනය කිරීම සහ ආයතනික අගයන් පිළිග ැනීම විශ්වාස කරන්නෙමු. එබැවින් ආයෝජන මණ්ඩලයේ විනය සංග්‍රහය මගින් එහි සෑම සේවකයෙකුගෙන්ම අපේක්ෂා කරන ආචාරධර්ම අනුගමනය කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදේ. විනය සංග්‍රහය මගින් 'විනයසංග්‍රහය' සහ 'විනය ක්‍රියාමාර්ග රීති' යටතේ මණ්ඩලයේ සේවකයින් විසින් සිදුකරණ විෂමාචාරයක් හෝ වරදක් සම්බන්ධ යම් සිද්ධියක් සඳහා නිසි පරිදි පියවර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරිපත් කෙරේ.

කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීමේ ආයෝජන මණ්ඩල ප්‍රවේශය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සිය ශ්‍රම බලකාය උද්යෝගිමත්ව සහ සතුටින් තැබීමට හැකිවනසේ සේවකයින් කේන්ද්‍රකරගත් ශක්තිමත් ක්‍රියාපටිපාටියක් අනුගමනය කරයි. ඒ අතරම ආයතනය සඳහා අගය ලබාදීම මගින් අපගේ ජාතික වගකීම ඉටුකළ බව තහවුරු වේ. අපගේ මානව සම්පත් කළමනාකරණ ක්‍රියාකාරකම් බඳවා ගැනීමේ සිට තෝරා ගැනීම, මානව සම්පත් සංවර්ධනය, වන්දි ගෙවීම සහ සේවක සුභසාධන ප්‍රතිලාභ සහ විනය දක්වා විහිදේ. අයෝජන මණ්ඩලයේ සිය සේවා කාලය පුරාම ඔවුන්ට මනා සහයක් ලැබෙන බව සහ රැකබලා ගන්නා බව තහවුරුකර ගැනීම සඳහා මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇති අතර මධ්‍යගතව අධීක්ෂණය කෙරේ. මෙම කාර්යයන් ඉටු කිරීමේදී සමානාත්මතාව, අපක්ෂපාතිත්වය සහ අචාරධර්ම අනුගමනය කරන බව අපි අවධාරණය කරන්නෙමු.

රාජ්‍ය සේවය ආයෝජන මණ්ඩලයේ සාමාජිකයින් සියල්ලන්ගේම දැක්ම සහ ඉදිරියට ගෙනයන බලය වන අතර අපගේ මානව සම්පත් ක්‍රියාකාරකම් රජයේ නීති, නියෝග සහ ප්‍රතිපත්ති තීරණයන්ට අනුකූලවන බව තහවුරු කෙරේ. සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැළසීම සඳහා වන ප්‍රමුඛ ආයතනය වශයෙන් අප ජාතියට ඉටුකළ යුතු වගකීම පැහැර නොහරින අතර මෙම ජාතික වගකීම ඉටුකිරීම සඳහා අප කාර්ය මණ්ඩලය මෙහෙයවීම සඳහා සෑම පියවරක්ම ගනු ලැබේ. රාජ්‍ය ආයතනයක් සමබන්ධයෙන් වන විශ්වාසනීයත්වය සහ අනුකූලතාවය ආරක්ෂා කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්ති මගින් සියලු මානව සම්පත් කාර්යයන් මෙහෙයවන බව සඳහන්කළ යුතුය.

අවශ්‍ය හැකියාවන් සහිත පිරිස නියමිත ස්ථානයට නිසි වේලාවට විනිවිදභාවයෙන් යුත් ක්‍රමවේදයක් හරහා බඳවාගැනීමේ සහ තෝරාගැනීමේ කාර්යයන් සිදුවන බව තහවුරුකර ඇති අතර මානව සම්පත් සංවර්ධනය මගින් අප කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය තහවුරු කෙරේ. වන්දි ගෙවීමේ, ප්‍රතිලාභ ලබාදීමේ සහ සේවක සුභසාධන කාර්යයන් මගින් අප කාර්ය මණ්ඩලය එක හා සමානව වන්දි ලබාදෙන බව සහ ඔවුන්ගේ සුභසිද්ධිය පිළිබඳව සළකා බලන බව තහවුරු වේ.

අප සේවකයින්ට සහය වීම සඳහා මෙම සියළු ක්‍රමවේදයන් ක්‍රියාත්මක වීමත් සමග ඔවුන් කාර්යාලයේදී මෙන්ම ඕනෑම ස්ථානයකදී වගකීමෙන් යුතුව කටයුතු කරන බව අපේක්ෂා කෙරේ. විනය ක්‍රියාමාර්ග මගින් සේවකයින්ගේ විෂමාචාර සඳහා ඉක්මනින් ක්‍රියාමාර්ග ගැනීමත් ආයතනයේ කාර්යයන් සඳහා ඇතිවිය හැකි බාධක වැළැක්වීමත් තහවුරු කෙරේ.

කාර්ය මණ්ඩලයේ සංයුතිය

ආයෝජන මණ්ඩලය, කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය 418 දෙනෙකුගෙන් සහ දිවයින පුරා අනෙකුත් ස්ථානයන්හි සේවයකරන කාර්ය මණ්ඩලය 780 දෙනෙකුගෙන් සමන්විත වේ. අපගේ සේවක පිරිස සේවක කාණ්ඩ තුනකට අයත් වේ. අප කණ්ඩායමෙන් 47% ක් ප්‍රධාන කාර්යාලය සහ අපනයන සැකසුම් කලාප හා උද්‍යානවල සිටින විධායක කාණ්ඩයට ඇතුළත් වේ. ඉතිරි 53% කළමනාකරණ සහකාර නිලධාරීන්ගෙන් සහ ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලයෙන් සැදුම්ලත් විධායක නොවන ශ්‍රේණියට ඇතුලත් වේ. සමස්ත කාර්ය මණ්ඩලයෙන් 22%ක් කළමනාකරණ සහකාර නිලධාරීන් වන අතර 31%ක් ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය වේ.

අප සේවකයින් සතු විවිධත්වය සැමවිටම අගය කරන අතර ඒ සඳහා පහසුකම් සැපයීම තුලින් විවිධ වූ පිරිසක් සහිත වීම අප ආයතනය සතු සුවිශාල ශක්තිය වේ. ආයතනය තුළ සිය රැකියාවේ ප්‍රගතිය අත්කර ගැනීම සඳහා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයමටම එක හා සමාන අවස්ථාවන් සලසනු ලැබේ. සියලු සේවක කාර්ය මණ්ඩලයන්හි ස්ත්‍රී හා පුරුෂ නියෝජනය දැකිය හැකිය.

අප කණ්ඩායම විවිධ අධ්‍යාපනික හා වෘත්තිය පසුබිම් සහිත සේවකයින්ගෙන් සමන්විතවේ. සේවකයින් 1198 දෙනාගෙන් 564ක් විධායක කාණ්ඩය නියෝජනය කරන අතර 331 දෙනෙක් උපාධිධාරීන්ද ඉන් 166 දෙනෙක් පශ්චාත් උපාධිධාරීන්ද 54දෙනෙක් වෘත්තීය ආයතනයන්හි ද සාමාජිකත්වය දරනු ලැබේ. ඔවුන් ව්‍යාපාර පරිපාලනය, විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, රාජ්‍ය කළමනාකරණය, ගිණුම්කරණය, සමාජ විද්‍යාව, නීතිය සහ රේගු පරිපාලනය වැනි විවිධ විෂය ක්ෂේත්‍රයන් මගින් පැමිණ ඇති බැවින් අප සේවකයින්ගේ විවිධවූ අධ්‍යාපනික පසුබිම් මගින් අයෝජන මණ්ඩලය අබණ්ඩව සුවිශාල ප්‍රතිලාභ ලබයි.

වර්තමානයේ ආයතන අතර පවතින දැඩි තරඟකාරීත්වය හමුවේ අප ආයතනයේ සාර්ථකත්වය කෙරෙහි අප කාර්ය මණ්ඩලයේ අබණ්ඩ වෘත්තීය සංවර්ධනය ඉවහල්වන බව අපි විශ්වාස කරන්නෙමු. එබැවින් ආයෝජන මණ්ඩලය විසින් එහි සේවකයින්ට සිය වෘත්තීය සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීමට සහයවීමේ ආයතනික වගකීම පිළිබිඹු කරන අධ්‍යාපනය සඳහා විස්තීර්ණ දායකත්ව ප්‍රතිපත්ති, උසස්වීම් ප්‍රතිපත්ති හඳුන්වාදී ඇත.


පුහුණුව සහ සංවර්ධනය


ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සිය සේවකයින්ට ඔවුන්ගේ වෘත්තීය සහ පුද්ගල සංවර්ධනය සඳහා සහය ලබාදේ. අප විසින් විධායක, විධායක නොවන ශ්‍රේණිවල සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් සඳහා ආයතනය තුළ පුහුණු වැඩසටහන් 16ක් සහ බාහිර පුහුණු වැඩසටහන් 40කට වැඩි ගණනක් පවත්වා ඇත. ආයතනය තුළ පුහුණු වැඩසටහන් සහ බාහිර පුහුණු වැඩසටහන් මගින් විධායක ශ්‍රේණියේ නිලධාරීන් 400ක් පමණ ද විධායක නොවන සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් 250ක් පමණ ද පුහුණු කර තිබේ.

තවද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සහයෝගීතාවය ඇතිව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සඳහා උපායමාර්ගික නායකත්ව සංවර්ධන වැඩසටහනක් ද නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සඳහා කළමනාකරණ සංවර්ධන වැඩසටහනක් ද ක්‍රියාත්මක කරනු ලැබීය. මෙම වැඩසටහන මගින් ඊළඟ මට්ටමේ වගකීම් භාරගැනීමට හැකිවන අයුරින් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ නායකත්ව/කළමනාකරණ හැකියාවන් ඇතුලුව ඔවුන්ගේ අන්තර්පුද්ගල, සංකල්පමය සහ තාක්ෂණික හැකියාවන් සංවර්ධනය කිරීම කෙරෙහි යොමුව ඇත.

මානව සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

ගෝලීය වසංගතයෙන් පසුව රටේ ඇතිවූ ආර්ථික අර්බුදයත් සමගින් අපගේ ජාතික වගකීම ඉටුකිරීම සඳහා වන ගමන වඩාත් අභියෝගාත්මක වූ අතර ඒ වෙනුවෙන් වැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. මානව සම්පත් දෙපාර්තමේන්තුව වශයෙන් අප දැනටද පවතින ආර්ථික සහ සමාජ අභියෝග යන් ජයගැනීමට අපගේ සේවකයින්ට සහයවීමට කැපවී සිටී. විශේෂයෙන්ම ආයතනයේ කාර්යයන් සඳහා තාක්ෂණය අනුගත කර ගැනීම සඳහා අප කාර්ය මණ්ඩලයට සහයවීමට තාක්ෂණය අනුගත කරගැනීම, වැඩ කිරීමට පහසු පරිසරයක් නිර්මාණය කිරීම සහ අපගේ කාර්ය මණ්ඩලය වඩාත් ඉහළ මට්ටමට ගෙන ඒම සඳහා ඔවුන්ගේ ධාරිතාවන් ගොඩනැගීමේ නව මාර්ග සොයා යාමේ සිය කාර්යභාරය අබණ්ඩව සිදුකරනු ලබයි.





සාමාජීය බලපෑම



NAITA හවුල්කාරිත්වය

පාසල් හැරයන්නන්ගේ නිපුණතා වැඩිදියුණු කරගැනීමට මෙන්ම ඔවුන්ට රැකියා මාර්ග සොයාගැනීමට උපකාරී වීම සඳහා ආයෝජන මණ්ඩලය NAITA සමග හවුල්කාරීවී ඇත

කලක් තිස්සේ කර්මාන්ත සඳහා අභියෝගයක්ව පවතින තාක්ෂණික නිපුණතා මට්ටමේ මානව ප්‍රාග්ධන හිඟයට පිළියම් යෙදීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමග සහයෝගයෙන් කටයුතු කරනු ලැබීය.

හොරණ අපනයන සැකසුම් කලාපයේ ඇති ව්‍යවසායයන්හි මෙහෙයුම් සඳහා අවශ්‍ය විදුලි කාර්මිකයන්, පෑස්සුම්කරුවන්, ජලනල කාර්මිකයින්, වෑද්දුම්කරුවන් ආදීන්ගේ හිඟයකට මුහුණදී ඇත. මෙහිදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ NAITA ආයතනය ඒකාබද්ධව අවශ්‍යවන නිපුණතා හා විශේෂඥ දැනුම ලබාදීම මගින් පාසල් හැරයන්නන් පුහුණු කරන අතර එය ශ්‍රමබලකායේ හිඟය අවම කර ගැනීමට ඉවහල් වී ඇත.

තවද ව්‍යවසායයන්හි අවශ්‍යතාවන් අනුව පුහුණුව නිමකිරීමෙන් අනතුරුව මෙම ආධුනික ශිල්පීන් අදාල සමාගම් සහ කර්මාන්තශාලාවලට අන්තර්ග්‍රහණය කරනු ඇත.



සවිබල ගැන්වීම

සේවක සවිබල ගැන්වීම

ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි සේවකයින් බල ගැන්වීමේ ක්‍රියාමාර්ගයක් ලෙස ආයෝජන මණ්ඩලය විසින් සිය ව්‍යවසායයන්හි සේවකයින්ගේ සහභාගිත්වය ඇතිව කාන්තා දිනය, සේවක ආරක්ෂක සතිය ආදීය සමරනු ලැබීය.



රැකියා පිළිබඳ දැනුවත් කිරීම

දිශාභිමුඛගත කිරීමේ වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

අපනයන සැකසුම් කලාපයන්හි පිහිටුවා ඇති කාර්මික සබඳතා ඒකක සහ රැකියා බැංකු විසින් අදාල රාජ්‍ය ආයතනවල සහයෝගීතාවය ඇතිව අළුතින් බඳවාගනු ලැබූ සේවකයින් සඳහා අඛණ්ඩව දිශාභිමුඛගත කිරීමේ වැඩසටහන් සහ සමාජ සංවාද, සේවා ස්ථානයේ සහයෝගීතාවය, විනීත සේවා ස්ථාන ක්‍රියාකාරකම්, සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ.



රැකියා බැංකු වෙබ් අඩවිය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ රැකියා ප්‍රතිස්ථාපන මධ්‍යස්ථානය (Job Bank) එහි ව්‍යවසායයන්හි මනිස්බල අවශ්‍යතාවය සපුරාලීම සඳහා විශාල සේවාවක් ඉටුකරයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සමාජ වගකීමක් ලෙස රැකියා වෙළඳපලෙහි පවතින අවස්ථාවන් පිළිබඳව සාමාන්‍ය ජනතාව වෙත සන්නිවේදනය කිරීම සඳහා නොමිලේ සපයන සේවාවක් වශයෙන් BOI රැකියා බැංකු වෙබ් අඩවිය ආරම්භකර ඇත.



රැකියා මාර්ගෝපදේශනය

තරුණයින් සඳහා රැකියා පොළ/වෘත්තීය මාර්ගෝපදේශන සම්මන්ත්‍රණ

රැකියා අපේක්ෂකයන් සහ පාසල් හැරයන්නන් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි පවතින රැකියා අවස්ථාවන් කෙරෙහි යොමුකිරීම සහ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් හරහා ඔවුන් සුදුසු වෘත්තීය ප්‍රවේශයක් වෙත යොමුකිරීම සඳහා අනෙකුත් අදාල ආයතනවල සහයෝගීතාවය ඇතිව රැකියා පොළ / වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සංවිධානය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් පහසුකම් සළසන ලදී.

දිවා සුරකුම් මධ්‍යස්ථාන

අපනයන සැකසුම් කලාපයන්හි දිවා සුරකුම් මධ්‍යස්ථාන සහ පෙර පාසල් පිහිටුවීම මගින් කලාපය තුල ආරක්ෂිත ස්ථානයක තම දරුවන් තබාගනිමින් සිය රැකියාවන්හි නිරතවීමට සේවකයින් සඳහා අවස්ථාව ලැබී ඇත. විසඳුමක් ලබාදේ. මෙමගින් රැකියා හැරයාම අඩුවී ඇති අතර අළුතින් සේවයට එක්වන අය අතර කලාප පිළිබඳ ආකර්ෂණීය හැඟීමක් ඇතිකිරීමට ඉවහල් වී ඇත.


2022 වසරේ මූල්‍ය සමාලෝචනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා මූල්‍ය කාර්යසාධනය	2022 (රු. මිලි.)	2021 (රු. මිලි.)	වෙනස (%)
ආදායම	5,973	4,911	22
මුළු මෙහෙයුම් වියදම්	(4,075)	(3,788)	(8)
මෙහෙයුම් ලාභය	1,889	1,123	69
මූල්‍ය අදායම	1,402	330	325
මූල්‍ය වියදම්	(7)	(10)	30
බදුකරණයට පෙර අතිරික්තය	**3,294**	**1,443**	**128**
බදු වියදම්	(372)	(79)	(371)
බදුකරණයට පසු අතිරික්තය	2,922	1,364	114
වෙනත් විස්තීර්ණ ආදායම්	(6)	81	(107)
මුළු විස්තීර්ණ ආදායම	2,916	1,445	102
වසර අවසානයේ මූල්‍ය තත්ත්වය			
වත්කම්	68,662	64,533	6
සමකොටස්	50,691	47,391	7

අතිරික්තය

සමාලෝචනයට ලක්වූ වසර සඳහා බදු පෙර අතිරික්තය රු. මිලි. 3,293.71 වේ. අදාල වසර සඳහා බදු පසු ශුද්ධ අතිරික්තය 2021 වසරේ අගයවූ රු. මිලි. 1,363.41 සිට රු. මිලි. 2,921.66 දක්වා වැඩිවී ඇත. පෙර වසර හා සැසඳීමේදී මෙය 114%ක වැඩිවීමකි.


රු. මිලි.



ආදායම

මුළු මෙහෙයුම් ආදායම 22%ක වැඩිවීමක් වාර්තා කරමින් 2021 අගය වූ රු. මිලි. 4,911.18 සිට රු. මිලි. 5,973.23 දක්වා වැඩිවී ඇත. ප්‍රධාන වශයෙන්ම බදු සංශෝධන සහ ඇමරිකන් ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අඩුවීම මෙම ආදායම වැඩිවීම වාර්තා වීමට හේතුවී ඇත. දළ ආදායමේ සංරචක මෙහෙයුම් පදනම් සහ මෙහෙයුම් නොවන පදනම් අයිතම වලින් සමන්විත වේ. මෙහෙයුම් පදනම් ආදායම බිම් කුලිය, වාර්ෂික ගාස්තු, ආනයන/අපනයන සේවා ගාස්තු, ජල ආදායම, බලපත්‍ර ගාස්තු, ගිවිසුම් සකස්කිරීමේ ගාස්තු සහ විවිධ ආදායම් වලින් සමන්විත වේ. මෙහෙයුම් නොවන පදනම් ආදායම ප්‍රධාන වශයෙන් පොලී ආදායම මගින් ලැබේ. කාලසීමාව සඳහා වන පොලී ආදායම රු. මිලියන 1,072.25කින් වැඩිවී ඇති අතර එය 2021 වසර හා සංසන්දනය කිරීමේදී 325%ක වැඩිවීමකි. ඉහත වැඩිවීම රජයේ සුරකුම්පත්වල පොලී අනුපාතය වැඩිවීම හේතුවෙන් වාර්තාවී ඇත. කාලසීමාව සඳහා වන පොලී ආදායම රු. මිලි. 1,402.02කි.


රු. මිලි



වියදම

2022 වසරේ දී මුළු මෙහෙයුම් වියදම 2021 අගය වූ රු. මිලි. 3,788.18 සිට රු. මිලි. 4,074.63 දක්වා 8%කින් වැඩිවී ඇත. පරිපාලන වියදම් 6%කින් වැඩිවී ඇති අතර පුද්ගල වියදම්, කාර්ය මණ්ඩලයේ සුභ සාධනය සහ ප්‍රවාහනය හා අදාල වියදම් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවිය.


රු. මිලි.



රජයේ අයබදු

සමාලෝචනයට ලක්වන වසර සඳහා බදු පෙර අතිරික්තය රු. මිලි. 3.293.71කි. අවසන්වූ වසර සඳහා වන ශුද්ධ බදු පසු අතිරික්තය 2021 වසරේ අගයවූ රු.මිලි. 1,363.41 සිට රු. මිලි. 2,921.66 දක්වා වැඩි වී ඇත. මෙය පසුගිය වසර හා සැසඳීමේ ඩදී 114%ක වැඩිවීමකි.

රු. මිලි.



ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
2013 සිට 2022 දක්වා ආදායම් ප්‍රකාශය පිළිබඳ විශ්ලේෂණය

මූල්‍ය වර්ෂය	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022
ආදායම	**2,721,805,586**	**3,100,162,918**	**3,213,557,727**	**3,605,145,347**	**3,711,862,608.00**	**3,889,614,384**	**4,646,091,668.00**	**4,251,299,069**	**4,911,181,363**	**5,973,226,716**
අඩුකළා; වියදම්										
මෙහෙයුම් වියදම්	337,008,595	299,383,652	276,739,350	265,978,777	265,378,860.00	267,056,012	322,000,510	273,552,379	286,687,112	327,676,479
පරිපාලන වියදම්	1,981,947,246	2,301,683,057	2,488,716,775	2,639,675,029	2,724,737,397.00	2,846,961,666	3,165,507,063	3,192,487,029	3,344,826,022	3,536,143,256
රජයේ බදු	148,120,375	161,676,718	121,148,196	116,511,263	190,599,853.00	230,591,904	254,568,577	88,787,598	98,955,130	179,015,723
අනෙකුත් වියදම්	26,300,318	25,419,143	26,390,038	26,528,404	29,943,193.00	30,301,326	31,290,987	36,038,612	57,713,652	31,799,404
මුළු වියදම්	**2,493,376,534**	**2,788,162,570**	**2,912,994,359**	**3,048,693,473**	**3,210,659,303**	**3,374,910,907**	**3,773,367,137**	**3,590,865,618**	**3,788,181,916**	**4,074,634,862**
මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ප්‍රතිඵල	**228,429,052**	**312,000,348**	**300,563,368**	**556,451,874**	**501,203,305**	**514,703,477**	**872,724,531**	**660,433,450**	**1,122,999,447**	**1,898,591,854**
මූල්‍ය ආදායම	100,765,279	135,105,411	118,628,543	222,265,759	336,920,319.00	344,450,042	411,444,914	321,579,138	329,766,108	1,402,022,856
මූල්‍ය වියදම්	15,646,075	14,534,281	12,025,173	10,588,937	10,940,559.00	7,737,398	10,657,560	13,873,362	10,216,636	6,900,963
ශුද්ධ මූල්‍ය ආදායම	**85,119,204**	**120,571,130**	**106,603,370**	**211,676,822**	**325,979,760**	**336,712,644**	**400,787,354**	**307,705,775**	**319,549,472**	**1,395,121,893**
බදුකරණයට පෙර අතිරික්තය	**313,548,256**	**432,571,478**	**407,166,738**	**768,128,696**	**827,183,067**	**851,416,121**	**1,273,511,885**	**968,139,226**	**1,442,548,919**	**3,293,713,748**
බදු වියදම්	22,627,258	30,786,759	26,031,646	47,342,329	70,759,017.00	92,323,030	115,204,576	81,246,467	79,143,866	372,056,361
වසර සඳහා අතිරික්තය	**290,920,998**	**401,784,719**	**381,135,092**	**720,786,367**	**756,424,050**	**759,093,091**	**1,158,307,309**	**886,892,759**	**1,363,405,053**	**2,921,657,387**
අනෙකුත් විස්තීර්ණ ආදායම										
බැඳීම් මත ආයුගණක (ලාභ)/(පාඩු)	6,283,354	28,339,987	(29,335,586)	(14,247,556)	25,054,316.00	10,973,058	51,499,585	75,380,123	(81,555,310)	(5,809,848)
මුළු විස්තීර්ණ ආදායම	**284,637,644**	**373,444,732**	**410,470,678**	**735,033,923**	**731,369,734**	**748,120,033**	**1,106,807,724**	**811,512,636**	**1,444,960,363**	**2,915,847,539**

2022
මූල්‍ය ප්‍රකාශන

(2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා)

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා	සටහන	2022 රු.	2021 රු.
ආදායම	**4**	**5,973,226,716**	**4,911,181,363**
අඩුකලා : වියදම්			
මෙහෙයුම් වියදම්	**6**	327,676,479	286,687,112
පරිපාලන වියදම්	**7**	3,536,143,256	3,344,826,022
රජයේ තීරුබදු	**8**	179,015,723	98,955,130
වෙනත් වියදම්	**9**	31,799,404	57,713,652
මෙහෙයුම් වියදම් එකතුව		4,074,634,862	3,788,181,916
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් අතිරික්තය		**1,898,591,854**	**1,122,999,447**
මූල්‍ය ආදායම		1,402,022,856	329,766,108
මූල්‍ය වියදම්		6,900,963	10,216,636
ශුද්ධ මූල්‍ය ආදායම	**10**	**1,395,121,893**	**319,549,472**
බදුකරණයට පෙර අතිරික්තය		**3,293,713,748**	**1,442,548,920**
බදු වියදම්		372,056,361	79,143,866
වසර සඳහා අතිරික්තය		**2,921,657,387**	**1,363,405,054**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	2022 රු.	2021 රු.
වසර සඳහා අතිරික්තය		**2,921,657,387**	**1,363,405,054**
වෙනත් විස්තීර්ණ ආදායම්			
අඩුකලා: නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ආයුගණක ලාභ/(පාඩු)	**21.1**	(5,809,848)	81,555,310
වසර සඳහා විස්තීර්ණ ආදායමේ එකතුව		**2,915,847,539**	**1,444,960,364**

පිටු අංක 37 සිට 59 දක්වා වන "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන	2022 රු.	2021 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	11	16,590,833,444	16,447,957,171
ආයෝජන දේපළ	12	39,509,893,878	38,874,669,885
අස්පෘශ්‍ය වත්කම්-මෘදුකාංග		1,202,500	1,267,500
සිදුකෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්	13	663,949,641	1,164,136,045
මුල්‍යමය වත්කම්	14	1,836,212,997	1,031,956,017
ජංගම නොවන වත්කම් එකතුව		**58,602,092,461**	**57,519,986,618**
ජංගම වත්කම්			
භාණ්ඩ වට්ටෝරු		19,624,040	16,504,778
මුල්‍ය වත්කම්	15	6,642,855,587	199,851,910
ව්‍යවසායයන්ගෙන් ලැබිය යුතු දෑ	16	514,554,207	318,462,069
අත්තිකාරම් ගෙවීම් හා වෙනත් ලැබිය යුතු දෑ	17	713,888,827	529,944,140
මුදල් හා මුදලට සමාන දෑ	18	2,169,387,636	5,948,317,760
ජංගම වත්කම් එකතුව		**10,060,310,297**	**7,013,080,657**
වත්කම් එකතුව		**68,662,402,758**	**64,533,067,276**
සම කොටස් හා වගකීම්			
සම කොටස්			
සමුච්චිත අරමුදල		35,350,600,314	32,050,723,381
සංචිත		15,340,693,234	15,340,693,234
		50,691,293,548	**47,391,416,615**
විලම්භිත ආදායම	20	16,281,302,053	15,821,737,118
විලම්භිත වියදම්	19	(485,280,787)	(428,295,356)
		15,796,021,266	**15,393,441,762**
සම කොටස් එකතුව		**66,487,314,814**	**62,784,858,377**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	21	306,570,548	278,808,543
ජංගම නොවන මූල්‍යමය වගකීම්	22	13,375,247	34,512,895
ජංගම නොවන වගකීම් එකතුව		**319,945,795**	**313,321,438**
ජංගම වගකීම්			
ජංගම මූල්‍යමය වගකීම්	22	21,137,648	24,456,313
සමුච්චිත වියදම් හා වෙනත් ගෙවිය යුතු දෑ	23	1,647,784,849	1,386,146,594
ගෙවිය යුතු බදු		186,219,651	24,284,555
ජංගම වගකීම් එකතුව		**1,855,142,149**	**1,434,887,461**
සම කොටස් හා වගකීම් එකතුව		**68,662,402,758**	**64,533,067,276**

පිටු අංක 37 සිට 59 දක්වා වන "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුවේ
ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කිරීම හා අත්සන් කිරීම කරනු ලබන්නේ,

දිනේෂ් වීරක්කොඩි **සභාපති**	**ජයමින් පැල්පොල** **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**	**රේණුකා එම්. වීරකෝන්** **අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)**	**එස්.ඒ.ඩී.ඩී.සුරවීර** **විධායක අධ්‍යක්ෂ - මූල්‍ය**

26/07/2023

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

සම කොටස් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට

	සමුච්චිත අරමුදල රු.	ප්‍රත්‍යාගණන සංචිත රු.	සම කොටස් **වල එකතුව** රු.
2021 ජනවාරි 01 දිනට ශේෂය	**20,911,194,024**	**15,340,693,234.00**	**36,251,887,258**
වසර සඳහා විස්තිර්ණ ආදායමේ එකතුව	1,444,960,364	-	1,444,960,364
ඒකාබද්ධ අරමුදල සඳහා දායකත්වය රු. මිලියන 500			
2021 වසර තුළ ගෙවන ලද ලාභාංශ	**(415,945,716)**		(415,945,716)
2021 වසර තුළ ගෙවන ලද වැටුප් හා දීමනා අයකර ගැනීම්	**(21,068,786)**		(21,068,786)
2022 වසරේදී කාර්යමණ්ඩලයට ගෙවිය යුතු වැටුප් හා දීමනා අයකර ගැනීම් - භාණ්ඩාගාරය මගින් ලැබිය යුතු	**(51,492,525)**		(51,492,525)
සම කොටස් හරහා සෘජුවම හඳුනාගත් බදුකුලී සහ අනෙකුත් ලැබිය යුතු දෑ මත බලපෑම අයකර ගැනීම	**(11,492,973)**		(11,492,973)
සම කොටස් හරහා සෘජුවම හඳුනාගත් ආදායම ගැලපීම්-2020 ඉන්වොයිසි අවලංගුවීම	(3,904,116)	-	(3,904,116)
සම කොටස් හරහා ගිණුම්කරණ ප්‍රතිකර්ම වෙනස්වීම හේතුවෙන් ආදායම හඳුනා ගැනීම WEPZ නිවාස යෝජනාක්‍රමය	1,149,000	-	1,149,000
සම කොටස් හරහා සෘජුවම හඳුනාගත් බදුකුලී ආදායම හඳුනාගැනීම-2020	14,024,450	-	14,024,450
භාණ්ඩාගාරය සඳහා ගනුදෙනු - යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති	(25,584,946)	-	(25,584,946)
සම කොටස් හරහා සෘජුවම වත්කම් හඳුනාගැනීම	3,278,034	-	3,278,034
සම කොටස් හරහා සෘජුවම ආපසු ලියාතබන ලද ඉඩම් වාරිකය	(35,093,432)	-	(35,093,432)
රජයේ ප්‍රදාන - සම කොටස් හරහා සෘජුවම හඳුනාගත් ඉඩම - ආරබොක්ක ඉඩම	10,240,700,000	-	10,240,700,000
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**32,050,723,378**	**15,340,693,234**	**47,391,416,612**
2022 ජනවාරි 01 දිනට ශේෂය	**32,050,723,378**	**15,340,693,234**	**47,391,416,612**
වසර සඳහා විස්තිර්ණ ආදායමේ එකතුව	2,915,847,539	-	2,915,847,539
ඒකාබද්ධ අරමුදල/ ගෙවිය යුතු ලාභාංශ සඳහා දායකත්වය [1]	(500,000,000)	-	(500,000,000)
සම කොටස් හරහා සෘජුවම වත්කම් හඳුනාගැනීම [2]	599,057,567	-	599,057,567
සමකොටස් හරහා සෘජුවම පොත්වලින් ඉවත් කරන ලද වත්කම් 3	(486,100)	-	(486,100)
අවලංගුවූ ව්‍යාපෘති වල ඉඩම් වාරිකය සමකොටස් හරහා ආදායමක් ලෙස හඳුනාගැනීම [4]	156,751,776	-	156,751,776
සමකොටස් හරහා සෘජුවම හඳුනාගත් බිම් කුලිය ආදායම හඳුනාගැනීම [5]	23,684,671		23,684,671
සමකොටස් හරහා සෘජුවම හඳුනාගත් බිම් කුලිය ආදායමක් ලෙස පොත්වලට ඇතුලත් කිරීම [6]	105,014,515	-	105,014,515
2015 වසර සඳහා වියදම සමකොටස් හරහා සෘජුවම හඳුනාගැනීම [7]	(155,947)	-	(155,947)
වියදම් සමකොටස් හරහා කලින්ම සෘජුවම හඳුනාගැනීමේ බලපෑම 8	162,916	-	162,916
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**35,350,600,314**	**15,340,693,234**	**50,691,293,548**

පිටු අංක **37** සිට **59** දක්වා වන **"මූල්‍ය ප්‍රකාශන** සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශන වල **සංකලිත කොටසකි.**

1. රජයට අයත් ව්‍යවසායන්ට අදාල ලාභාංශ ප්‍රතිපත්තියට අනුකූලව ආයෝජන මණ්ඩලය රු. මිලියන 500ක් මහභාණ්ඩාගාරය සඳහා වන ලාභාංශ ලෙස වෙන්කර ඇත.
2. ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුලත්කර නැති වත්කම් සමකොටස් ගිණුම හරහා සෘජුවම හඳුනාගෙන ඇත. (ආයෝජන කලාපීය නොවන ඉඩම් හා ගොඩනැගිලි)

3.1 ආයෝජන මණ්ඩලය විසින් ඒකල පිහිටි ටෙලිකොම් නම් ඉඩමේ අයිතිය NWS & DB වෙත පවරා දී ඇත

3.2 රුහුණුපුර ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිහිටි ඉඩම උෆනකාර්යසාධන ව්‍යවසායන් හෝ උෆන උපයෝජිත වත්කම් පුනර්ජීවන පනත යටතේ අත්පත් කරගනු ලැබීය

4. අවලංගුවූ ව්‍යාපෘතිවල ඉඩම් වාරික ආදායම හඳුනාගැනීමේ ආදායම් බලපෑම

5. පෙර වසරේ බිම් කුලී ආදායම හඳුනාගැනීම මත ආදායම බලපෑම

6. මෙහෙයුම් සිදුනොකරන ව්‍යාපෘති වල ඉඩම් වෙන්කිරීමේ ගාස්තු මගින් ආදියම හඳුනාගැනීම මත ආදායම බලපෑම

7. 2015 වසර සඳහා ආදායම හඳුනාගැනීම - පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප

8. වියදම කලින් හඳුනාගැනීමේ බලපෑම - වතුපිටිවල අ.සෑ.ක අපජල පවිත්‍රාගාරය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා	2022 රු. (මිලි)	2021 රු. (මිලි)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ		
මෙහෙයුම් මගින් උත්පාදනය වූ මුදල් (24 සටහන)	**(3,956.53)**	**1,633.22**
ආදායම් බදු ගෙවීම්	(210.12)	(66.41)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ගෙවීම	(69.41)	(53.69)
ලැබූ විලම්භිත ආදායම	945.06	343.57
ලැබූ ගොඩනැගිලි වාරිකය	-	40.70
මුදල් ආපසු ගෙවීම්	(29.68)	-
ලැබූ ඉඩම් වෙන්කිරීම		-
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මුල්‍ය ඇතුලට ගැලීම්/(පිටතට ගැලීම්)	**(3,320.68)**	**1,897.39**
ආයෝජන ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ		
ලැබූ ආයෝජන ආදායම	1,131.72	296.98
රජයේ සුරක්ෂණයන්හි ආයෝජනය කිරීම්	(730.65)	(457.94)
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	(35.64)	(36.82)
අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම්	-	(1.30)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල්	2.20	0.32
ස්ථාවර වත්කම් විකිණීම මත දරන ලද වියදම්	-	(0.89)
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්	(376.24)	(448.94)
විලම්භිත වියදම්	(3.17)	(6.24)
මහා පරිමාණ ව්‍යාපෘතිවල යටිතල පහසුකම් සැළසීම	-	(0.06)
අයෝජන ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මුල්‍ය ඇතුලට ගැලීම්/(පිටතට ගැලීම්)	**(11.78)**	**(654.89)**
මූල්‍යයන ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ		
ගෙවූ කල්බදු වාරික	(30.53)	(39.30)
භාණ්ඩාගාරය වෙත අරමුදල් මාරුකිරීම්	(415.95)	-
මූල්‍යන ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මුල්‍ය ඇතුලට ගැලීම්/(පිටතට ගැලීම්)	**(446.47)**	**(39.30)**
මුදල් හා මුදලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)	(3,778.93)	1,203.20
වසර ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ	5,948.32	4,745.11
වසර අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ	**2,169.39**	**5,948.31**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

1. වාර්තා කරනු ලබන ආයතනය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 1978 අංක 4 දරණ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය යටතේ ස්ථාපනය කරනු ලැබීය. එහි ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, එවෙලොන් චතුරශ්‍රය, කොළඹ 01 යන ස්ථානයේ පිහිටා තිබේ.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, සම කොටස් වෙනස්වීම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් හා සටහන් සමග මණ්ඩලයේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තා කිරීමේ ප්‍රමිති නියෝජනය කරන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS/ LKAS) අනුකූලව පිළියෙලකර ඇත.

2.2 ඇස්තමේන්තු, විනිශ්චයන්, හා උපකල්පනයන් භාවිතා කිරීම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම්වල වාර්තාගත ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන සිදුකිරීම හා වාර්තා කරන දිනට අවිනිශ්චිත වගකීම් අනාවරණය කිරීම අවශ්‍ය කෙරේ. ඇස්තමේන්තු හා මූලික උපකල්පන සිදුකෙරෙමින් පවතින පදනම මත සමාලෝචනය කෙරේ. කෙසේවුවද, මෙම උපකල්පන හා ඇස්තමේන්තුවල අවිනිශ්චිතභාවය මගින් අනාගතයේදී වත්කම් හෝ වගකීම්වල ඉදිරියට ගෙන එන අගයට බලපාන ප්‍රමාණාත්මක ගැලපීම් අවශ්‍යය වියහැකි ප්‍රතිඵල ඇතිකළ හැකි වේ.

2.3 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා ආයෝජන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන 2023 ජූලි 26 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ සටහන් වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමතකර සහ නිකුත් කිරීමට බලය ලබාදී ඇත.

2.4 තුලනාත්මක තොරතුරු

වත්මන් කාලසීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම සහ අන්තර් කාලසීමාවේ අනුකූලතාවය වැඩිදියුණු කිරීම සඳහා පෙර වර්ෂය හා සම්බන්ධ තුලනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශයන්හි අනාවරණයකර ඇත. වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් ලබාදීම සඳහා වත්මන් වසරේ වර්ගීකරණය සමග අනුකූලවීම අවශ්‍යවන විටක තුලනාත්මක තොරතුරු නැවත වර්ගීකරණයකර ඇත.

2.5 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් මණ්ඩලයේ අඛණ්ඩව ඉදිරියට පැවතීමේ හැකියාව තක්සේරුකර තිබේ. මණ්ඩලයට පුරෝකථනය කල හැකි අනාගතයක් සඳහා අඛණ්ඩව මෙහෙයවීම සඳහා අවශ්‍ය පමණ සම්පත් ඇති බවට සාධාරණ අපේක්ෂාවක් ඇත. මණ්ඩලයේ අනාගතය පිළිබඳ පවතින සියළු තොරතුරු සැලකීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇවර කිරීම හෝ මෙහෙයුම් අවසාන කිරීමේ අවශ්‍යතාවයක් නිරීක්ෂණයකර නොමැත. ඒ අනුව, මණ්ඩලය විසින් මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දිගටම ඉදිරි අඛණ්ඩ පැවැත්ම පදනම අනුගත කරගෙන ඇත.

2.6 ව්‍යවහාර හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මණ්ඩලයේ ව්‍යවහාර කරනු ලබන මුදල් ඒකකය වන්නේ ශ්‍රී ලංකා රුපියල් වන අතර මුල්‍ය ප්‍රකාශන ද ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

3 *වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති*

3.1 මූල්‍ය වත්කම්

මණ්ඩලය මගින් එහි මූල්‍ය වත්කම්, ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කරනු ලබන අතර මූල්‍ය වත්කම් ආයෝජනය කිරීමේ සාධාරණ අගයට මනිනු ලැබේ. මූලික හඳුනා ගැනීමේදීම කළමනාකරණය විසින් වර්ගීකරණය තීරණය කරනු ලබන අතර ආයෝජනය කරන හා අත්පත් කරගනු ලබන අරමුණ සහ එහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ මත රඳා පවතී.

(අ) වර්ගීකරණය

(i) *ණය හා ලැබිය යුතු දෑ*

ණය හා ලැබිය යුතු දෑ යනු ක්‍රියාකාරී වෙළඳපලෙහි මිළ ගණන් දක්වා නොමැති ස්ථාවර හෝ තීරණය කල හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මුල්‍ය වත්කම් වේ. සාමාන්‍ය ගනුදෙනු මගින් ජනිත වන ලැබිය යුතු දෑ ද මෙම කාණ්ඩය යටතේ වර්ගීකරණය කරනු ලබන අතර හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ.

(ii) *සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් - (කල්පිරෙන තෙක් තබාගනු ලබන මූල්‍ය වත්කම්)*

ස්ථාවර හෝ තීරණය කළහැකි ගෙවීම් හා ස්ථාවර කල්පිරීමක් සහිත මණ්ඩලයේ කළමනාකාරිත්වයට ධනාත්මක ආකල්පයක් හා කල්පිරීම සඳහා රඳවා තැබීමේ හැකියාව ඇති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල්පිරෙන තෙක් තබාගනු ලබන මූල්‍ය වත්කම් වේ. මෙම මූල්‍ය වත්කම් හඳුනාගෙන මූල්‍ය තත්ව ප්‍රකාශයේ සාධාරණ අගයට වර්ගීකරණය කරනු ලැබේ.

(ආ) *හානිකරණය*

යම් අපේක්ෂිත ණය පාඩුවක් ඇතිදැයි තීරණය කිරීම සඳහා මූල්‍ය වත්කම් සෑම මූල්‍ය තත්ව ප්‍රකාශය දිනයට සමාලෝචනය කෙරේ. එවන් සඳහනක් ඇතිනම්, වත්කම් යථා තත්වයට පත්කර ගැනීමේ ප්‍රමාණය ඇස්තමේන්තුගත කෙරේ. මණ්ඩලය විසින් සෑම මූල්‍ය මෙවලම් කාණ්ඩයක් හරහාම ඇගයීමක් පදනම් කරගෙන අපේක්ෂිත ණය පාඩුව මනිනු ලැබේ. මුදලේ කාලීන වටිනාකම, ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කිරීම, ගනුදෙනුකරුගේ තත්වය විශ්ලේශණය, ලැබිය යුතු දෑ උප කණ්ඩායම, ණයකරුවන්ගේ ගෙවීම් පිළිබඳ විස්තර, සමාන්තර අගයන්, ණය අවදානමේ කැපී පෙනෙන වැඩිවීමක් ඇගයීම, ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය අපහසුතා, නෛතික ගැටළු, සාධාරණ හා අනුග්‍රාහක තොරතුරු සහ අනාගත ආර්ථික තත්වයන් පුරෝකථනය වැනි කරුණු ගණනාවක් මගින් මෙම ඇස්තමේන්තු කිරීම් සිදු කෙරේ.

වත්කමක ඉදිරියට ගෙනයන ප්‍රමාණය හෝ එහි මූල්‍ය උත්පාදන ඒකක එහි ආපසු අයකර ගැනීමේ ප්‍රමාණය ඉක්මවා යනවිට හානිකරණ පාඩුව හඳුනා ගැනේ. හානිකරණ පාඩු ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

(ඇ) *වත්කම් හා බැරකම් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම.*

පූර්ව කාලීනව හඳුනාගනු ලැබූ හානිකරණ පාඩු, ඒවා අඩුවී තිබේද හෝ තවදුරටත් පවතින්නේ දැයි යම්කිසි සඳහන් කිරීමක් සඳහා එක් එක් වාර්තාකරණ දිනයට තක්සේරු කරනු ලැබේ. ආපසු අයකර ගත හැකි ප්‍රමාණය තීරණය කිරීම සඳහා භාවිතා කළ ඇස්තමේන්තුවල වෙනසක් වී ඇතිනම් හානිකරණ පාඩු ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ.

3.2 *දේපළ, පිරියත හා උපකරණ*

(අ) *හඳුනාගැනීම සහ මැනීම*

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයකිරීම හා යම් සමුච්චිත හානිකරණ පාඩු අඩුකර පිරිවැයට දක්වනු ලැබේ. වත්කම අත්පත්කර ගැනීම සඳහා සෘජුවම දායකවන වියදම් පිරිවැයට අතුලත්වේ. ආයතනය විසින් ඉදිකරන ලද වත්කම්වල පිරිවැයට, ද්‍රව්‍ය සඳහා වන පිරිවැය, සෘජු කම්කරු ශ්‍රමය. වත්කම එමගින් අපේක්ෂිත භාවිතය සඳහා කාර්ය තත්වයට ගෙන ඒමට සෘජුවම දායකවන වෙනත් යම් පිරිවැය, අයිතමය කොටස් කිරීම හා ඉවත් කිරීමේ පිරිවැය සහ ඒවා පිහිටි ස්ථානයේ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන පිරිවැය ඇතුලත්වේ.

ප්‍රත්‍යාගණන වත්කම් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 (SLFRS 1) අනුව, දේපළ, පිරියත හා උපකරණවල අගය තක්සේරු කිරීමේදී 2011 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂයවීම් අඩුකර 2011 ජනවාරි 01 දිනට ඇති පිරිවැය ලෙස සලකා බලනු ලැබේ.

(ආ) *ක්ෂය කිරීම*

දේපළ, පිරියත හා උපකරණයන්හි සියලු අයිතමයන්හි ක්ෂය කිරීම පිරිවැය/තක්සේරුව අනුව සෘජු රේඛා පදනම මත ගණනය කරනු ලබන අතර එය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. ස්ථාවර වත්කම් භාවිතයට ගත හැකි විට ඒවා මිලට ගත් වර්ෂයේදී ඒ මත ක්ෂය කිරීම් අයකරනු ලැබේ. දේපළ පිරියත හා උපකරණ ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය අනුව වාර්ෂිකව ක්ෂය කර ඇත. සින්නක්කර ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

වත්කම් කාණ්ඩය	*වසරක් සඳහා ක්ෂය කිරීමේ ප්‍රතිශතය*	*කාල සීමාව (වසර)*
ගොඩනැගිලි හා ව්‍යුහයන්	5 - 10	10 - 20
පිරියත හා යන්ත්‍ර	10	10
සවිකිරීම් හා උපාංග	10	10
කාර්යාලීය ලී බඩු හා උපකරණ	10	10
පරිගණක	33.33	3
මෝටර් රථ	20	5

(ඇ) හඳුනාගනු ලැබූ මූල්‍ය වත්කමක් හෝ වගකීමක් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම

දේපළ හා උපකරණ අයිතම අපහරණය කිරීම මත හෝ ඒවා භාවිතයෙන් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට ඒවායේ ඉදිරියට ගෙන එනු ලබන ප්‍රමාණය ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ. එසේ දේපළ, පිරියත හා උපකරණ අයිතම ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම නිසා ඇති වන ලාභ හෝ පාඩු, විකිණීමෙන් ලැබෙන මුදල් හා දේපළ වල ඉදිරියට ගෙන එන අගය අතර වෙනස ලෙස තීරණය කරනු ලබන අතර එය ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. (අනෙකුක් මෙහෙයුම් (විවිධ)/ ආදායම්/වියදම් තුළ)

(ඈ) තදනන්තර වියදම්

දේපළ, පිරියත හා උපකරණයක අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය. සංවර්ධනය, ඉදිකිරීමේ පිරිවැය, එම කොටස මගින් ආයෝජන මණ්ඩලයට අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අන්තර්ගතවීමේ ප්‍රවනතාවයක් ඇතිනම් සහ එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැකිනම් අයිතමයේ ඉදිරියට ගෙන එන අගයට හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ එදිනෙදා සේවාකිරීමේ පිරිවැය එම වියදම් දරන පරිදි ආදායම් සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

(ඉ) දේපළ, පිරියත හා උපකරණ විකිණීම මගින් ලාභ/පාඩු

දේපළ, පිරියත හා උපකරණ විශ්‍රාම ගැනීම හෝ අපහරණය මත යම් ලාභ හෝ පාඩු විකිණීම සිදුවන කාලසීමාවේදී හඳුනාගනු ලබන අතර අනෙකුත් මෙහෙයුම් ආදායම් හා වියදම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

(ඊ) සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්

මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනයට නිම නොකරන ලද ව්‍යාපෘති සඳහා වසර තුල දරනු ලැබූ ප්‍රාග්ධන වියදම් සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වනු ලැබේ. ඒවා යම් සමුච්චිත හානිකරන පාඩුවක් අඩුකර පිරිවැයට දක්වනු ලැබේ. සිදුකරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් කළමනාකරණය අපේක්ෂා කරන පරිදි මෙහෙයුම් කිරීමට සුදුසු ස්ථානයේ හා තත්වයේ ඇතිවිට දේපළ, පිරියත හා උපකරණ, විලම්භිත වියදම් සහ මහා පරිමාණ ව්‍යාපෘති සඳහා දරන ලද වියදම් යන අදාල වත්කම් කාණ්ඩයට මාරුකරනු ලැබේ.

(උ) *කල්බදු වත්කම්*

මූල්‍ය වගකීම් යටතේ අත්පත් කර ගනු ලබන වත්කම් අදාල මූල්‍යමය වගකීම හඳුනා ගැනීමත් සමග කල්බදුගත් මෝටර් වාහන කාණ්ඩය යටතේ ප්‍රාග්ධනීකරණය හා ඇතුලත් කිරීම සිදුකෙරේ. මූල්‍ය කල්බදු යටතේ තබාගනු ලබන වත්කම් ඒවා භාවිතා කරණ කාලසීමාව අනුව ක්ෂය කරනු ලැබේ.

(ඌ) ව්‍යුහයන්

ව්‍යුහයන්ගේ සාධාරණ අගය මුලික උප කාණ්ඩ හතක් යටතේ තක්සේරුකර තිබේ. එක් ප්‍රධාන උප කාණ්ඩයක් හා සම්බන්ධ සියලු අයිතම හා උපාංග එක් කොටසක ඒකකයක් සාදන ලෙස සලකනු ලැබේ.

3.3

(අ) *ආයෝජන දේපළ*

ආයෝජන දේපළ එකී වත්කම් ආයෝජන දේපළ යටතේ වර්ගීකරණය කරනු ලබන දිනයට පවතින පිරිවැයට (පිරිවැය මොඩලය) අනුව සඳහන් කරනු ලැබේ.

ආයෝජන දේපළ හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමේ හැකියාවක් පවතින්නේනම් හා ආයෝජන දේපළ වල පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිනම් ආයෝජන දේපළ හඳුනා ගනු ලැබේ. බදු කුලී ආදායම් ඉපයීමට ඇති දේපළ ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇත. ආයෝජන දේපළ වල සාධාරණ අගය මනිනු නොලබන අතර දේපළ කීපයක් හැර ආයෝජන දේපළ පිළිබඳ වෘත්තීය සුදුසුකම් දරන, පිළිගත් ස්වාධීන තක්සේරුකරුවකු විසින් තක්සේරුවක් සිදුකර නොමැත.

ආයෝජන දේපළ අපහරණය කර ඇති විට හෝ ඒවා ස්ථීර වශයෙන්ම භාවිතයෙන් ඉවත්කල විට සහ ඒවායේ අපහරණය මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරනවිට ආයෝජන දේපළ ශේෂ පත්‍රයෙන් කපාහරිනු ලැබේ.

(ආ) *ක්ෂය කිරීම (ක්‍රමක්ෂය)*

ඉඩම් හැර ආයෝජන දේපළ වල පිරිවැය/තක්සේරු කිරිම මත ක්ෂය කිරීම සෘජු රේඛා පදනම මත ගණනය කරනු ලැබේ. ආයෝජන දේපළ, ප්‍රයෝජනවත් ආයු කාලය මත පහත පරිදි වාර්ෂිකව ක්ෂයකර ඇත.

වත්කම් කාණ්ඩය	**වසරක් සඳහා ක්ෂය කිරීමේ ප්‍රතිශතය**	**කාල සීමාව (වසර)**
ගොඩනැගිලි	5	20

3.4 අස්පෘශ්‍ය වත්කම්

(අ) හඳුනා ගැනීම හා මැනීම

ආයෝජන මණ්ඩලය විසින් අත්පත් කරගනු ලැබූ සීමිත ප්‍රයෝජනවත් ආයුකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් හඳුනා ගනු ලබන අතර පිරිවැය අඩුකර සමුච්චිත ක්‍රමක්ෂය හා හානිකරණ පාඩුව ගණනය කෙරේ.

(අ) ක්‍රමක්ෂය

අස්පෘශ්‍ය වත්කම් ඒවා භාවිතයට ගනුලබන දින සිට ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය අනුව සෘජු රේඛා පදනමින් ආදායම් ප්‍රකාශයේ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ක්‍රමක්ෂය හඳුනා ගැනේ.

වත්කම් කාණ්ඩය	වසරක් සඳහා ක්ෂය කිරීමේ ප්‍රතිශතය	කාල සීමාව (වසර)
මෘදුකාංග බලපත්‍ර - Kiosk	5	20

(ඇ) තදනන්තර වියදම්

එය අදාල වන විශේෂ වත්කමකට ඇතුලත් අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩිකරනවිට පමණක් තදනන්තර වියදම් ප්‍රාග්ධනීකරණය කෙරේ. අනෙක් සියලු වියදම් ඒවා වියදම් දරන පරිදි ආදායම් සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

(ඇ) විශ්‍රාමයාම සහ අපහරණය

අස්පෘශ්‍ය වත්කම් අපහරණය හෝ ඒවායේ භාවිතය හා තදනන්තර අපහරණය මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරණ විට ශේෂ පත්‍රයෙන් කපා හැරේ. අස්පෘශ්‍ය වත්කමක අයිතමයක් අපහරණය මත ලාභ හෝ පාඩු අපහරණය මගින් ලැබෙන මුදල් ඉදිරියට ගෙනඑන ප්‍රමාණය සමග සන්සන්දන කිරීම මගින් තීරණය කරන අතර ආදායම් හා අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ "අනෙකුත් මෙහෙයුම් ආදායම් / (වියදම්)" තුල ශුද්ධ පදනම මත හඳුනා ගැනේ.

3.5 භාණ්ඩ වට්ටෝරු

සියළු භාණ්ඩ වට්ටෝරු අඩු පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි කල හැකි අගයට ගණනය කරනු ලැබේ. පළමුව ලැබූ පළමුව පිටකල පදනම (FIFO) මත පිරිවැය තීරණය කෙරේ.

3.6 *අනෙකුත් වත්කම්*

වෙනත් වත්කම් වලට අනෙකුත් ණය ගැතියන්, ලැබිය යුතු දෑ, අත්තිකාරම්, තැන්පතු හා පූර්ව ගෙවීම් ඇතුලත් වේ.

(අ) අත්තිකාරම්, තැන්පතු, පෙර ගෙවූ වියදම්

එක් මූල්‍ය වර්ෂයකට වඩා වැඩියෙන් ප්‍රතිලාභ හෝ සම්බන්ධතාවයක් ඇති ලෙස සලකනු ලබන වියදම් අත්තිකාරම්, තැන්පතු හා පෙර ගෙවුම්, වියදම් ලෙස වර්ගීකරණය කෙරේ. කාලසීමාව අවසානයේදී එකී වියදම් ඊට අදාල කරුණ අනුව කාල සමානුපාතික පදනම මත කපා හරිනු ලැබේ.

(ආ) අනෙකුත් ණයකරුවන්

අනෙකුත් ණයකරුවන් හානිපූරණ පාඩු අඩුකල පිරිවැයට හඳුනාගනු ලැබේ.

3.7 *මුදල් හා මුදලට සමාන දෑ*

මුදල් හා මුදලට සමානදෑ අත ඇති මුදල් හා දන්නා මුදල් ප්‍රමාණයකට පහසුවෙන් පරිවර්තනය කල හැකි හා අගය වෙනස්වීමේ නොසලකා හැරිය හැකි අවදානමකට ලක්වන කෙටිකාලීන ඉහල ද්‍රවශීල ආයෝජන වලින් සමන්විත වේ. මේවා කෙටිකාලීන මුදල් බැඳීම් ලබාගැනීමේ කාර්යය සඳහා රඳවා ගනු ලැබේ.

3.8 *මුදල් ප්‍රවාහ ප්‍රකාශය*

මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 7 (LKAS) අනුකූලව වක්‍ර ක්‍රමය යොදා ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

3.9 *සේවක ප්‍රතිලාභ*

(අ) නිර්වචිත දායකත්ව සැලසුම්

අදාල ප්‍රඥාප්ති හා නියෝගයන්ට අනුකූලව සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ (EPF) හා සේවක භාරකාර අරමුදලේ (ETF) දායකත්වය සඳහා සුදුසුකම් ලබයි. මණ්ඩලය විසින් සේවකයින්ගේ දළ වැටුපට අනුව, සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ස්ථාවර දායකත්වයන් ගෙවනු ලබන අතර ගෙවිය යුතු තවත් නෛතික හෝ ගිවිසුම්ගත බැඳීම් නොමැත.

(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් යනු නිර්වචිත දායකත්ව සැලසුම් වලට අමතර පශ්චාද්-සේවය කිරීමේ සැලසුම්වේ. මණ්ඩලය විසින් 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව පාරිතෝෂික ගෙවීම සඳහා බැඳී සිටී. ආයුගණක ගනණය කිරිමක් පදනම් කරගෙන පනත යටතේ විධිවිධාන සලසා ඇති පරිදි බැඳීම් තිරණය කෙරේ. ස්වාධීන ආයුගණක ආයතනයක් මගින් "ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය" භාවිත කරමින් වාර්ෂිකව ගණනය කිරීම් සිදුකරනු ඇත.

3.10 *වගකීම් හා ප්‍රතිපාදන*

පසුගිය සිද්ධියක් නිරාකරණය කිරීමේදී හා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත්වන සම්පත් පිටතට ගලායාමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවේ යයි අපේක්ෂිත වත්මන් නෛතික/සම්මුතික බැඳීම් ඇති විටෙක එය මූල්‍ය තත්ව ප්‍රකාශයේ බැඳීම් හා ප්‍රතිපාදන ලෙස හඳුනාගනු ලැබේ.

ණයදීමනාකරුගේ ඉල්ලීම අනුව හෝ මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනයට වසරක් තුල ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස සැලකේ. මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනට වසරකට පසුව ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් ලෙස සැලකේ.

අනෙකුත් වගකීම්

සමුච්චිත වියදම් ඇතුළු අනෙකුත් ණයකරුවන් අනෙකුත් වගකීම් වලට ඇතුලත් වේ. මේවා ඒවායේ සාධාරණ අගය ලෙස සැලකෙන ඓතිහාසික අගයට දක්වනු ලැබේ.

3.11 ආදායම හඳුනාගැනීම

සේවා/ගාස්තු මගින් ලැබූ හෝ ලැබියයුතු සේ සලකන ලබන ආදායම සාධාරණ අගයට මනිනු ලැබේ. බලපත්‍ර ගාස්තු හා ගිවිසුම් සැකසුම් ගාස්තු මුදල් පදනම මත හඳුනා ගැනේ.

- **බිම් කුලිය**
  ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ඉඩම් වසර 30 සිට 99 ක් දක්වා කාලසීමාවකට බදු දීම සඳහා ආයෝජකයින් සමග බදු ගිවිසුම් අත්සන් කරනු ලැබේ. බදු ගිවිසුම්වල සඳහන් විධිවිධාන අනුව පවරන ලද පරිශ්‍රයක් සඳහා කල්බදු කාලසීමාව වෙනුවෙන් හෝ ගිවිසුම අවසන්වන තෙක් වාර්ෂිකව බිම් කුලිය ගෙවීමට ආයෝජකයින් බැඳී සිටී.

- **වාර්ෂික ගාස්තු**

  ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ වන සියලු ආයෝජන මණ්ඩල ව්‍යවසායන් ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුලත් විය යුතු අතර ආයෝජන මණ්ඩලයට අයත් ආයෝජන කලාපයන්ගෙන් පිටත ක්‍රියාත්මක ව්‍යවසායන් ඒවා වසා දමන, මෙහෙයුම් අත්හිටුවන හෝ ගිවිසුම් අවලංගු කරන තෙක් ගිවිසුම ප්‍රකාරව වාර්ෂික දායක මුදලක් ගෙවීමට බැඳී සිටී.

- **ඉඩම් වාරිකය**

  ආයෝජන මණ්ඩලයේ ඉඩම් බදු ගැනීම සඳහා බදු ගිවිසුම් වලට ඇතුලත්ව ඇති සියලු ආයෝජකයින්, ගිවිසුම් අත්සන් කරන අවස්ථාවේදී ඉඩම් වාරිකය ලෙස අත්තිකාරම් ගෙවීමක් සිදු කිරීම අවශ්‍යය කෙරේ. ඉහත ආදායම ගිවිසුමේ දක්වා ඇති බදු කාලසීමාව තුළ හඳුනා ගැනේ.

(ආ) පොලී ආදායම

ලාභ හෝ පාඩු හරහා සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය මෙවලම් ඇතුළු පොලියක් සහිත සියලු මූල්‍ය මෙවලම් සඳහා වන පොලී ආදායම, ආදායම් ප්‍රකාශයේ "මූල්‍ය ආදායම" තුල හඳුනා ගනු ලැබේ.

(ආ) අනෙකුත් ආදායම් / විවිධ ආදායම්

(i) *අනෙකුත් ආදායම්*

අනෙකුත් ආදායම් සම්චිචිත පදනම මත හඳුනා ගැනේ. .

(ii) *දේපල, පිරියත සහ උපකරණ විකිණීම මගින් ලාභ/ (පාඩු)*

දේපල, පිරියත හෝ උපකරණ භාවිතයෙන් ඉවත් කිරීම හෝ අපහරණය මත යම් ලාභ හෝ පාඩු විකිණීම සිදුවූ කාලසීමාව තුළ හඳුනා ගනු ලබන අතර විවිධ ආදියම් හා වියදම් යටතේ හඳුනාගනු ලැබේ.

3.12 වියදම්

වියදම් හඳුනා ගැනීම.

(අ) ආදායම් වියදම

සියලු වියදම් සලකා බලන ලද සාධාරණ අගයට මතිනු ලබන අතර එම වියදම් අදාල වන කාලසීමාව අනුව හඳුනා ගැනේ. සියලු දන්නා වගකීම් සඳහා හා දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම සඳහා ප්‍රතිපාදන ලබාදීමෙන් පසු මණ්ඩලය උපයාගනු ලබන අතිරික්තය ආදායම් ප්‍රකාශයේ දන්වනු ලැබේ.

(ආ) ප්‍රාග්ධන වියදම්

ආයතනය සඳහා හෝ ආයතනයේ සේවා/නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීමේ අරමුණින් ස්ථීර ආකාරයෙන් වත්කම් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරනු ලැබූ වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

ණය ගැනීම්/ මූල්‍ය කල්බදු හා සම්බන්ධ සියලු පොලී සහ දරන ලද අනෙකුත් වියදම් ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසු ප්‍රමාණයට හැර ශුද්ධ මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වියදම් කෙරේ.

(ඇ) මූල්‍ය ආදායම සහ මූල්‍ය වියදම්

ශුද්ධ මූල්‍ය ආදායම, ආදායම් හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලබන ආයෝජනය/තැන්පත් කර ඇති අරමුදල් මත පොලිය, කාර්යමණ්ඩල ණය සහ මූල්‍යමය බැඳීම් මත පොලියෙන් සමන්විතවේ.

ණය ගැනීම්/මූල්‍ය කල්බදු හා සම්බන්ධ සියලු පොලී සහ දරන ලද වෙනත් පිරිවැය, ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුවන ප්‍රමාණයට හැර ශුද්ධ මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වියදම් දරන පරිදි වියදම් කෙරේ.

3.13 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක. 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන (LKAS 7) අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතාකර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙලකර ඇත.

3.14 අදාල පාර්ශව ගනුදෙනු

අදාල තොරතුරු ඊට අදාල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල අනාවරණය කර ඇත.

3.15 බදුකරණය.

ආදායම් බදු මූල්‍ය ප්‍රකාශනයේ වාර්තා කරනු ලබන ආකාරයට පොලී ආදායමේ මූලිකාංග මත පදනම්ව ඇති අතර 2107 අංක 24 දරණ දේශීය ආදායම් පනත හා ඒ සඳහා වන සංශෝධනයන්ගේ විධිවිධානයන්ට අනුකූලව ගණනය කරනු ලැබේ.

3.16 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

